# ශ්‍රී ලංකන් එයාලයින්ස්

# 2011-12 වාර්ෂික වාර්තාව

**ආයතනික තොරතුරු**

**නෛතික ආකෘතිය**

පොදු සීමිත වගකීම් සමාගමකි.

**සමාගම ලියාපදිංචි කිරීමේ අංකය**

PB 67

**අධ්‍යක්ෂවරු**

නිශාන්ත වික්‍රමසිංහ - සභාපති
නිහාල් ජයමාන්න, ජ.නී.
කපිල චන්ද්‍රසේන-අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි
ෂමීන්ද්‍ර රාජපක්ෂ
මනිලාල් ප්‍රනාන්දු
ලක්ෂ්මී සංගක්කාර
සනත් උක්වත්ත
සුසන්ත රත්නායක

**සමාගමේ ලේකම්**

මිල්ඩ්‍රඩ් පීරිස්

**ලියාපදිංචි කාර්යාලය**

ගුවන් සමාගම් මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ
කටුනායක
ශ්‍රී ලංකාව

**විගණකවරු**

අර්න්ස්ට් ඇන්ඩ් යංග්
වරලත් ගණකාධිකාරීවරු
තැ.පෙ. 101
කොළඹ 10

## අපගේ දැක්ම

ආසියාවේ වඩාත්ම ප්‍රිය මනාප ගුවන් සමාගම බවට පත්වීම

## අපගේ මෙහෙවර

ගුවන් ප්‍රවාහන ව්‍යාපාරකාර්යයෙහි නිරතව අප සිටින්නෙමු.විශ්වාසදායක හා සුපසන්න ප්‍රවාහන අත්දැකීමක් අප අපගේ සේවා ලාභීන් වෙත සපයන්නෙමු.අප අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත නව්‍ය, වෘත්තීයමය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වූ විවිධ සේවා සලසා දෙන්නෙමු. ශ්‍රී ලංකාව ලාභදායී වශයෙන් අලෙවිකරණය කිරීම හා ශ්‍රී ලංකාවේ සමාජීය සුභසාධනය කෙරෙහි දායක වීම පිළිබඳ කොටස් හිමියන්ගේ අපේක්ෂා අප විසින් සාක්ෂාත් කරන්නෙමු. අප ප්‍රවීණ, පෙරටුගාමී හා අනලස්ව ක්‍රියාත්මක වන කණ්ඩායමකි.අපගේ දායකත්ව මෙහෙවර ප්‍රසාදජනක වූද, ඵලදායී වූද එකකි.

# සුවිශේෂී කරුණු

| | | සමූහය 2012 | සමූහය 2011 | සමාගම 2012 | සමාගම 2011 |
|---|---|---|---|---|---|
| **මූල්‍ය** | | | | | |
| ආදායම් | රු.මි. | 92,257.04 | 78,515.24 | 90,544.22 | 77,125.45 |
| මෙහෙයුම් වියදම | රු.මි. | 109,177.00 | 81,569.55 | 109,376.82 | 81,334.34 |
| බදු පූර්ව අලාභය | රු.මි. | (17,161.04) | (176.74) | (19,675.42) | (377.75) |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | රු.මි. | (17,171.99) | (202.32) | (19,678.71) | (381.61) |
| ශුද්ධ වත්කම් | රු.මි. | 69,763.23 | 41,218.62 | 66,571.05 | 38,139.46 |
| කොටස් හිමියන්ගේ අරමුදල | රු.මි. | 4,153.55 | 6,302.55 | (1,438.90) | 3,216.82 |
| **ප්‍රවාහනය** | | | | | |
| මගී ධාරිතාව | ඒ.එස්.කේ.මිලියන | | | 14,248.94 | 12,481.41 |
| සමස්ථ ධාරිතාව | ඒ.ටී.කේ. මිලියන | | | 1,978.33 | 1,755.23 |
| ප්‍රවාහනිත මගී සංඛ්‍යාව | ආර්.පී.කේ.මිලියන | | | 11,270.23 | 9,584.02 |
| ප්‍රවාහනිත සමස්ථ පැටවුම | ආර්.ටී.කේ. මිලියන | | | 1,338.30 | 1,184.13 |
| මගී පැටවුම් සාධකය | % | | | 79.10 | 76.79 |
| සමස්ථ පැටවුම් සාධකය | % | | | 67.65 | 67.46 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | | | 86.53 | 76.19 |
| **කාර්ය මණ්ඩල ඵලදායිතාවය** | | | | | |
| සේවක පිරිස් බලය | සංඛ්‍යාව | 6,367 | 5,659 | 5,594 | 4,998 |
| ඒක සේවක ආදායම | මිලියන | 14.49 | 13.87 | 16.19 | 15.43 |
| ඒක සේවක අගය ආරෝපණය | මිලියන | (0.66) | 1.82 | (1.36) | 1.89 |

**2012 මාර්තු 31 දිනට ගුවන් යානා ඇණිය**

| | | | |
|---|---|---|---|
| A320-200 | සංඛ්‍යාව | 7 | 4 |
| A330-200 | සංඛ්‍යාව | 7 | 5 |
| A340-300 | සංඛ්‍යාව | 6 | 5 |
| ටිවින් ඔට ගුවන් යානා | සංඛ්‍යාව | 2 | 2 |
| වසරාවසාන සේවාගත ගුවන් යානා | සංඛ්‍යාව | 22 | 16 |

## සභාපතිවරයාගේ විමර්ශනය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ තිස්හතර වන වාර්ෂික මහ සභා රැස්වීමට ඔබ සැම සාදරයෙන් පිළිගැනේ. සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ 2011/12 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂිකවාර්තාව හා විගණනිත ගිණුම් ප්‍රකාශ මා ඔබ වෙත ඉදිරිපත් කර සිටිනුයේ සතුටු සිතිනි.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම 2011/12 වර්ෂය නම් කරන ලද්දේ "යළි පිබිදෙන වර්ෂය" යනුවෙනි. ඇත්ත වශයෙන්ම එය එලෙසින්ම සිදුවූ අතර, ඔබගේ ගුවන් සමාගමට මෙන්ම අප දේශයේ ගුවන්සේවා ආශ්‍රිත කර්මාන්ත වලටද ඉහළ මට්ටමේ පුනර්ජීවනයක් වසර තුළ සලසා ගත හැකි විය. මෙම මූල්‍ය වර්ෂය තුළ අප විසින් දරන ලද ප්‍රයත්නය ඔස්සේ 2012/13 වර්ෂයට අයත් ප්‍රථම කාර්තුව තුළවැදගත් කාර්ය සාධනයක්අත් කර ගැනීමට ඉවහල් වූ බව 'එයාලයින් එලයන්ස් වන් වර්ල්ඩ්' නැමැති කීර්තිමත් ගුවන් සමාගම් සංසදය ඔවුන්ගේ පත්කළ සාමාජිකයෙකු ලෙස තෝරා ගනු ලැබීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත කරන ලද ඇරයුම තුළින් විද්‍යාමාන විය.

### ශ්‍රී ලංකාවේ ආර්ථිකය

යුරෝපයේ දැඩි මූල්‍ය කඩාවැටීමත්, එක්සත් ජනපදයේ මන්දගාමී ආර්ථික ප්‍රකෘතිමත් භාවයත්, චීනය හා ඉන්දියාව යන රටවල සෙමින් සිදුවූ ආර්ථික වර්ධනයත් යන කරුණු මගින් ඇවිළී ගිය ගෝලීය ආර්ථික පසුබැස්ම මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාව සිය පශ්චාත් යුධ සමයට අයත් ආර්ථික කාර්යසාධනය ප්‍රසංශනීය ලෙස අඛණ්ඩව පවත්වා ගත්තේය.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ශ්‍රී ලංකා රජයේ දිගුකාලීන කේන්ද්‍රීය ඉලක්ක තුළ බල ජනන මධ්‍යස්ථාන, මහාමාර්ග, වරාය හා ගුවන් තොටුපළ යන යටිතල පහසුකම් සලසන්නා වූ ව්‍යාපෘති ආශ්‍රිතව විපුල වර්ධනයක් දැකිය හැකි විය.

### ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, 2011/12 වර්ෂය තුළ තවදුරටත් සුවිශේෂී සන්ධිස්ථානයක් පසුකර යමින් 2010/11 වර්ෂයේදී මෙරටට පැමිණි 709,191 ක්වූ සංචාරකයන් සංඛ්‍යාව හා සසඳන කළ 27% ක්වූ වර්ධනයක් සනිටුහන් වන පරිදි වාර්තාගත 901,375 ක්වූ සංචාරකයන් පිරිසක් මෙරටට ආකර්ශනය කර ගැනීමට සමත් විය.

දිගු කාලීන සංචරණය පිළිබඳව යුරෝපීය සංචාරකයන් තුළ පවත්නා කැමැත්ත යුරෝපාකරය තුළ පවත්නා ආර්ථික අවපාතය නිසා අඩාල වීමේ ඉඩකඩක් පවතී. කෙසේ වුවද, මැද පෙරදිග, දකුණු ආසියාව, ඈත පෙරදිග, ඕස්ට්‍රේලියාව සහ උතුරු ඇමරිකාව යන කලාප සිසාරා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විවිධාංගීකරණය විපුල ඵලදායකත්වයක් අත්කර දෙතැයි අපේක්ෂා කෙරේ.

**ජගත් ගුවන් ප්‍රවාහන කර්මාන්තය**

2011 ලිත් වර්ෂය තුළ ජගත් ගුවන් ප්‍රවාහන කර්මාන්තය ආශ්‍රිත මුළු ඇස්තමේන්තුගත ලාභය ඇ.ඩො. බිලියන 7.9 ක් වූයේය. කෙසේ වුවද, ක්‍රමයෙන් පිරිහෙමින් පවත්නා ගෝලීය ආර්ථික තත්ත්වය අඳුරු කඩතුරාවක් අතුරා තිබේ. අධික ඉන්ධන මිල ගණන් හේතුවෙන් 2011/12 වසර තුළ කර්මාන්තයට අහිතකර බලපෑම් ඇතිවිය. 2012 වසර තුළ කර්මාන්තයේ ලාභදායකත්වය ඇ.ඩො. බිලියන 3 දක්වා පහත වැටෙනු ඇතැයි ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන නියෝජිතායතනය (අයි.ඒ.ටී.ඒ.) බලාපොරොත්තු වේ.

**අප දේශයට උරදීම**

ආර්ථික වර්ධනයේ ස්වකීය උත්ප්‍රේරක කාර්යභාරය තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම කර්තව්‍ය ගණනාවකට මුල පිරුවේය. ඊට පහත සඳහන් දෑ ඇතුලත් විය.

- මත්තලඉදිකෙරෙනරටේදෙවනජාත්‍යන්තරගුවන්තොටුපළසඳහායටිතලපහසුකම්සැලසුම්කරණයෙහි හා පිරිසැකසුම්කරණයෙහි ලා සහය දැක්වීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (බී.අයි.ඒ.) තවදුරටත් පුළුල් කිරීමේ කටයුතු වලට සහය ලබාදීම.
- ඉලක්කගත ප්‍රධාන විදේශීය වෙළඳපළ තුළ ශ්‍රී ලංකාව පිළිබඳ ගෝලීය ප්‍රචාරණය සඳහා පහසුකම් සලසා ඊට මුල පිරීම.
- සංචාරක ව්‍යාපාරය, ක්‍රීඩා ඉසව් හා "මයිස් ක්‍රියාදාමය" (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන හා ප්‍රදර්ශන) තුළ ජාත්‍යන්තර සිද්ධිදාමවලට අනුබල සැලසීම.

**සම්මාන ලැබීම්**

විවිධ ගරු සම්මානවලින් පිදුම් ලැබීමේ ස්වකීය ජයග්‍රාහී දිගුකාලීන සම්ප්‍රදාය තවදුරටත් පවත්වා ගැනීමට ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමාලෝචිත වසර තුළ ද සමත් විය. පහත සඳහන් දෑ ඊට ඇතුලත් විය.

- 2012 ජාතික මානව සම්පත් කළමනාකරණ තිළිණ ප්‍රදානෝත්සවයේදී රජය සතු ව්‍යාපාර අංශයේ රජත සම්මානය හිමිකර ගැනීම.
- ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය දකුණු ආසියාවේ ප්‍රමුඛ පුහුණු මධ්‍යස්ථාන දහයෙන් එකක් ලෙස ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් නම් කිරීම.
- මෘදුකාංග වර්ධනය පිළිබඳ තත්ත්ව කළමනාකරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ ISO 9001:2008 සහතිකය ලබා ගැනීම.
- සිය තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය සඳහා ISO/IES 27001:2005 සහතිකය ලබා ගැනීම.
- දකුණු ආසියාවේ විශිෂ්ටතම ගුවන් සමාගම් මෙහෙයුම්කරු ලෙස ක්වාලාලාම්පූර් ජාත්‍යන්තර ගුවන් තොටුපළ සම්මානය හිමිකර ගැනීම.
- 2010 ශ්‍රී ලංකා සංචාරක සම්මාන උළෙලේදී "හෝල් ඔෆ් ෆේම්", වසරේ ගුවන් සමාගම, අභ්‍යන්තර සංචාරක ප්‍රවර්ධනය හා "සෙරන්ඩිබ් සඟරාව" නමැති හොඳම මුද්‍රිත මාධ්‍ය කරුණු නිරූපනය යන තිළිණ දිනා ගැනීම.

**2011/12 වර්ෂය**

- 2011/12 වසර තුළ ව්‍යාපාර සමූහයේ ආදායම රු.මි. 78,515.24 ක්වූ 2010/11 වසරේ ආදායම හා සංසන්දනාත්මකව රු.මි.92,257.04 ක් වූයේය.එය 18% ක වර්ධනයකි.
- මෙහෙයුම් වියදම ඉකුත් වසරේ රු.මි.81,569.55 ක් වූ අදාළ වියදම හා සංසන්දනාත්මකව රු.මි.109,177 ක් වෙමින් 34% ක ඉහළයාමක් වාර්තා කළේය.
- බදු පූර්ව අලාභය 2010/11 වසරේ රු.මි.176.74 ක් වූ අලාභයේ සිට රු.මි. 17,161.04 දක්වා ඉහළ ගියේය.
- බදු ගෙවූ පසු ශුද්ධ අලාභය 2010/11 වසරේ රු.මි.202.32 ක්වූ ප්‍රමාණය හා සංසන්දනාත්මකව රු.මි.17,171.99 ක් වූ ශුද්ධ අලාභයක් වූයේය.
- මුළු ගුවන් මගී ආදායම රු.මි. 72,620.39 දක්වා 20% කින් ඉහළ ගියේය.
- මගී කිලෝමීටර ප්‍රමාණ ආදායම ඉකුත් වසරේ අදාළ ආදායම වූ මිලියන 9584.02 ක්වූ ප්‍රමාණයට සංසන්දනාත්මකව මිලියන 11,270.23 ක් වූයේය.
- සමස්ථ ආසන සාධකය ඉකුත් වසරේ 76.79% ක් වූ ප්‍රමාණයට සංසන්දනාත්මකව 2011/12 වසර තුළ 79.10% වූයේය.
- 2011/12 වසර තුළ ගුවන් සමාගම මිලියන 3.46 ක් වූ මගීන් සංඛ්‍යාවක් ප්‍රවාහනය කරන ලද අතර, එය පසුගිය වසරේ මිලියන 2.87 ක් වූ මගීන්ගේ සංඛ්‍යාව එල්ලේ 21% ක වර්ධනයක් වූයේය.
- සමස්ථ ධාරිතාවය ඉකුත් වසරේ ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වූ මිලියන 1755.23 ක සිට මිලියන 1977.33 දක්වා ඉහළ ගියේය.
- මගී ධාරිතාවය ඉකුත් වසරේ ලබාගත හැකි ආසන කිලෝ මීටර ප්‍රමාණය වූ මිලියන 12481.41 සිට මිලියන 14248.94 ක් දක්වා ඉහළ නැංවිණි.
- ඒකක පිරිවැය 2010/11 වර්ෂය තුළ පැවති රු.45.92/ටො.කි.මී. ප්‍රමාණයේ සිට රු.56.03 /ටො.කි.මී. ප්‍රමාණයක් දක්වා ඉහළ යමින් 22% ක් වූ වර්ධනයක් වාර්තා කළේය.

පහත සඳහන් කරුණු හේතුවෙන් සමාගමේ අලාභය ඉහළ ගොස් ඇත.

- ඉන්ධන ගැලුමකට ගෙවන ලද සාමාන්‍ය මිල ඉකුත් වසරට වඩා 36% කින් වැඩිවීම.

- යුරෝපීය ආර්ථික අවපාතය හා අනිකුත් ගුවන් සමාගම් වෙතින් එල්ල වූ තරඟය හේතුවෙන් සතුටුදායක මට්ටමට වඩා අඩු ඵලදායකත්වයක් ලැබීම. ගුවන් යානා වල කැබින් උත්ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන ආශ්‍රිත ප්‍රතිලාභ ඉදිරියේදී ලැබීමට නියමිතය.

- අතිරේක ධාරිතාවයක් අත් කර ගැනීම සඳහාත්, උපස්ථම්භක සේවා වැඩි වර්ධනය සඳහාත් සැලකිය යුතු ආයෝජන සිදු කිරීම. ඒවායේ සමස්ථ ප්‍රතිලාභය ඉදිරි වර්ෂ වලදී අත් වනු ඇත.

ගැටළු නිරාකරණය සඳහා ගෙන ඇති පියවර:

- ඉන්ධන කාර්යක්ෂමතාවය උපරිම ලෙස පවත්වා ගැනීම. 2011/12 වසර තුළ නව ගුවන් යානා හඳුන්වා දීම හේතුවෙන් ගුවන් යානා ඇණිය තුළ වැඩි ඉන්ධන කාර්යක්ෂමතාවයක් ඇතිවී තිබේ. ගුවන්යානා ඉන්ධන වල සාමාන්‍ය මිල පසුගිය වසරට වඩා 2012/13 වසර තුළ පහත මට්ටමක් ගනු ඇතැයි පුරෝකථනය කෙරේ.
- පාඩු සිදුවන අංශ වල ගුවන් ගමන් වාර විධිමත් කිරීම හා එම ධාරිතාවය වඩා ලාභදායී ගුවන් ගමන් මාර්ග සඳහා යෙදවීම.
- නව ව්‍යාපාර පංති නිමවුම වඩා ප්‍රවේගවත්ව අලෙවිකරණය ඇතුළුව විවිධ උපාය මාර්ග ඔස්සේ ගුවන් මගී ධාරිතාව වැඩි කර ගැනීම.
- ගුවන් සමාගමේ විවිධාකාර වූ මෙහෙයුම් කටයුතු මගින් ආදායම් දායකත්වය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම කර්තව්‍යයෙහි ලා ඉංජිනේරු කටයුතු, තීරුබදු රහිත විකුණුම් , ගොඩබිම් මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පියසර විද්‍යායතනය, ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය හා සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගම දායක වනු ඇත.
- ශ්‍රී ලංකා රජය මගින් සලසා දෙනු ලබන ප්‍රාග්ධන දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන ණයගැනුම් ධාරිතාවයේ ඉහළ යාම සමාගමේ ද්‍රවශීලතා තත්වය වර්ධනය වීම සඳහා ඉවහල් වනු ඇතැයි අපේක්ෂිතය.

**සීමාසහිත ශ්‍රී ලංකා කේටරින් සමාගම**

ශ්‍රී ලංකන් කේටරින් සමාගම තවත් සාර්ථක වසරක් සනිටුහන් කළ අතර, ගුවන් යානාස්ථ ආහාර පාන සැපයුම් සේවා අවශ්‍යතා ඉතා විශිෂ්ට ලෙස සලසමින් සමාගමේ පුළුල් ව්‍යාප්තියට උර දුන්නේය. සමාගම සිය කාර්යභාරය විවිධාංගීකරණයට භාජනය කරමින් පැරණි ඕලන්ද රෝහල් වෙළඳ සංකීර්ණයේ “සිමොන්දු” වෙළඳ නාමය යටතේ අවන්හලක් විවෘත කළ අතර, එය සිදුවූයේ සමාගම සිය ප්‍රමුඛ ව්‍යාපාරික කටයුතු වන ගුවන් සමාගම් වලට ආහාර පාන සැපයීම, අතුරු මාර්ගස්ථ හෝටලයක් කළමනාකරණය කිරීම හා කර්මාන්තමය ලොන්ඩරි සේවා සැපයීම යනාදියට අමතර වශයෙනි.

ශ්‍රී ලංකන් කේටරින් සමාගම සමාලෝචිත වසර තුළ පහත සඳහන් සම්මාන වලින් පිදුම් ලැබීය.

- මැදපෙරදිග, අප්‍රිකා, දකුණු ආසියා, ඉන්දියානු උප මහද්වීපය සඳහා විශිෂ්ටතම කලාපීය ආහාරපානසැපයුම්කරුට හිමි ඉටිහාඩ් ගුවන් සමාගම් සම්මානය.
- පරිසර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ‘ග්‍රීන් ජොබ්ස්’ (හරිත රැකියා) සම්මානය.
- ජාතික හරිත සම්මාන ප්‍රදානෝත්සවයේදී පිරිනැමෙන අපද්‍රව්‍ය කළමනාකරණ ස්වර්ණ සම්මානය.
- ජාතික බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වූ ස්වර්ණ සම්මානය.

**අනාගතය**

වැඩි දියුණුකළ නිමවුමක් සහිතව වෙළඳපළ අවස්ථා උපරිම තත්වයට ගෙන ඒම සඳහා ඉලක්ක කෙරුණු පස් අවුරුදු සැලැස්මක් මත පදනම්ව අනාගත අභියෝග වලට මුහුණ දීමට ශ්‍රී ලංකන් ගුවන් සමාගම දැන් සූදානම්ය.

භාණ්ඩාගාර බැඳුම්කර අනුසාරයෙන් වූ රු. බිලියන 14.3 ක් වූ ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වසර තුළ සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය සවිමත් වූයේය. 1998 වසරෙන් පසුව එවැනි ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයක් සලසා දුන් ප්‍රථම අවස්ථාව මෙය විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ බැංකු සංසදයක් විසින් සපයා දෙන ලද සිව්වසරක කාලසීමාවක් පුරා දිවෙන ණය ගැණුම් පහසුකමක් මගින්ද 2012/13 වසරේ මුල් කාර්තුව තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය තව දුරටත් සවිබල ගන්වා ඇත. ඊළඟ සිව් වසර පුරාද දිවෙන පරිදි රජය විසින් සැලසුම් කරනු ලැබ ඇති වැඩිමනත් ප්‍රාග්ධන සැපයුම තුළින් සමාගමේ තිරසාර වර්ධනය සහතික කෙරෙමින් එහි ප්‍රාග්ධන පදනම තවදුරටත් ශක්තිමත් වනු ඇත.

2012/13 කාල පරිච්ඡේදය තුළ පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘති සමඟ එහි මෙහෙයුම් කටයුතු සවිමත් කිරීමට සමාගම අපේක්ෂා කරයි.

- ඒකීය ලොවක් සන්ධානයට අයත් විධික්‍රම හා පද්ධති සැකසුම් අපගේ විධික්‍රම හා පද්ධති සැකසුම් සමඟ සන්ධානගත කිරීම.
- අපගේ දිගු බඳ ගුවන්යානා වල මගී කැබින් මැදිරි උත්ශ්‍රේණිගත කිරීමේ කටයුතු නිම කිරීම.
- දකුණු කොරියාවේ සෝල් අගනගරය කරා සේවා දියත් කිරීම.
- ඒකීය ලොවක් සන්ධානයේ සාමාජිකයන්ද ඇතුළු අනෙකුත් ගුවන් සමාගම් සමඟ හවුල් සංකේත ගිවිසුම් සම්මුති වලට එළඹීම.
- A320 වර්ගයේ එයා බස් ගුවන් යානා නඩත්තුව සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි විශේෂිත ගුවන් යානාගාරයක් ඉදිකිරීම.
- A330 වර්ගයේ ගුවන්යානා වල නියමුවන් පුහුණු කිරීම සඳහා දෙවන අනුකාරක ගුවන් යානා සිමියුලේටර් මධ්‍යස්ථානයක් ඇරඹීම.

**ලාභාංශ**

අධික මෙහෙයුම් කටයුතු පිරිවැය හා අනාගතය වෙනුවෙන් වූ උපායමාර්ගික ආයෝජන කෙරෙහි අවධානය යොමුකිරීම යන කරුණු වල ප්‍රතිඵලයක් වශයෙන් 2011/12 කාල පරිච්ඡේදය තුළ අත්වූ අලාභය හේතුවෙන් අපගේ කොටස් හිමියන් සඳහා ලාභාංශ කිසිවක් නිර්දේශ කිරීමට මණ්ඩලයට හැකියාවක් නැත.

**අවසානය**

ශ්‍රී ලංකාවේ ගුවන් සේවා හා සංචාරක කර්මාන්තය පිළිබඳව විශාල අවධානයක් යොමු කළ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කැපවීම සම්බන්ධයෙන් මම මාගේ කෘතඥතාවය එතුමා වෙත පුද කරමි. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත්, ශ්‍රීලංකාවේ ගුවන් සේවා අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රියංකර ජයරත්න මැතිතුමාටත් ඔවුන් විසින් දක්වන ලද අනුබලය වෙනුවෙන්ද මගේ කෘතවේදීත්වය මෙහි ලා පළ කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ටද, ප්‍රධාන විධායක නිලධාරියාටද, සමාගමේ කළමනාකරණ කණ්ඩායම හා කාර්ය මණ්ඩලයටද ඔවුන්ගේ අප්‍රතිහත වෙහෙසකර කාර්යයට හා කැපවීම වෙනුවෙන් ඔවුන් වෙත මාගේ තුති ප්‍රණාමය මෙයින් පිරිනැමේ. අපගේ සමාගම කෙරෙහි තැබූ දිගුකාලීන විශ්වාසය හා දක්වන ලද අනුබලය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය ඇතුළු අපගේ කොටස් හිමියන් වෙත ස්තූති කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

**අ/කළේ:නිශාන්ත වික්‍රමසිංහ**
**සභාපති**

**2012.08.17**

## ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සමාලෝචනය

2011/12 වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු සමාලෝචනය හා සමාගමේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සංක්ෂේපයක් මවිසින් ඉදිරිපත් කරනුයේ සතුට පෙරදැරිවය.

**සමාලෝචිත වර්ෂය**

පසුගිය වසරේ මා මගේ සමාලෝචන වාර්තාව ආරම්භ කළේ "ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගම සිය ඉතිහාසය තුළ අභිනවයෙන් පරිච්ඡේදයක් ලියා තැබීමේ කාර්යයට දැන් අවතීර්ණ වී සිටී. ආර්ථික සංවර්ධන මාවත ඔස්සේ අප දේශය වෙනස් වෙමින් ප්‍රගතිය කරා පියමං කරන මෙවන් අවස්ථාවක අපගේ ගුවන් සමාගමද ඊට සරිලන ලෙස ඉන් අපේක්ෂිත ප්‍රමුඛ කාර්යභාරය ඉටු කිරීම සඳහා නව ජවයකින් පෙළ ගැසී සිටියි". යන වදන් සමූහයෙනි.

සැබැවින්ම 2011/12 වර්ෂය අප සමාගමට අභියෝගාත්මක වර්ෂයක් විය.

ගෝලීය කර්මාන්ත ක්ෂේත්‍රයේ පහත වැටීම ගුවන් සමාගමේ කටයුතු වලටද අහිතකර බලපෑම් එල්ල කළේය. දුෂ්කර මූල්‍ය තත්වයන් යටතේ වුවද අපගේ ව්‍යාපාරික සැලැස්ම හා අනුගත වෙමින් අපගේ මෙහෙයුම් කටයුතු හා ව්‍යාපාර ඒකක අප විසින් විස්තාරණය කළෙමු. ව්‍යාපාර කාර්ය මුලපිරීම් කීපයක් ක්‍රියාවට නැංවීම අප විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර ඉදිරියේදී සළකුණු කර ඇති පරිදිම ඒවා අපගේ ව්‍යාපාර හා ව්‍යාපාර නිමැවුම් වලට ස්ථිර වශයෙන්ම වැඩි අගයක් ආරෝපණය කර දී තිබේ.

**ඒකීය ලොවක් සන්ධානයේ සාමාජිකත්වය**

ජගත් කීර්තියට ලක්වූ ඒකීය ලොවක් ගුවන් සමාගම් සන්ධානයේ පත්කළ සාමාජිකයෙකු ලෙස ප්‍රවේශය සලසාගැනීමට අපට හැකිවී තිබේ.එමගින්, ගුවන් සමාගමේ වර්ධන උපාය මාර්ගය කෙරෙහි උපස්ථම්භක වනු පිණිස ලොව පුරා පිහිටි ගමනාන්ත 824 ක් හා සම්බන්ධ වෙමින්ද, ගුවන් සමාගම් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් සුවිශාල හා විශිෂ්ටතම වෙළඳ සන්නාම හා උරෙනුර ගැටෙමින් පියාසර කාර්යයෙහි නිරත වෙමින්ද සමාගම සතු ජාත්‍යන්තර ප්‍රතිමූර්තිය තවදුරටත් නිසැකවම පුළුල් කර ගැනීමට අපට හැකිවනු ඇත.

**ගුවන් යානා ඇණිය පුළුල් කිරීම**

ගුවන් සමාගම ස්වකීය පූර්ව තිස්තුන් වසරක ඉතිහාසය තුළ සිදු නොකළ පරිදි වැඩි ගුවන් යානා ප්‍රමාණයක් මෙම සමාලෝචිත වසර තුළ අත්කර ගත්තේය. යානා අත්කර ගැනීමේ වැඩසටහනට A320 වර්ගයේ ගුවන් යානා 05 ක් ද (මින් එකක් 2012/13 මුල් කාර්තුව තුළ), A330 වර්ගයේ ගුවන් යානා 02 ක්ද, A340ගුවන් යානා 01 ක් ද අන්තර්ගත කෙරුණි.A320 වර්ගයේ එක් පැරණි ගුවන්යානයක් අපගේ ගුවන් යානා ඇණිය වෙතින් විශ්‍රාම ගන්වන ලදි.

2011/12 මූල්‍ය වර්ෂය අවසාන වන විට සමාගමේ ගුවන් යානා ඇණිය පහත දැක්වෙන පරිදි සමන්විත විය.

- A320 වර්ගයේ ගුවන්යානා 07
- A330වර්ගයේ ගුවන්යානා 07
- A340 වර්ගයේ ගුවන්යානා 06
- ඩි හැවිලන්ඩ් ට්වින් ඔට (ගුවන් ටැක්සි) 02

**ගෝලීය ගුවන් මාර්ග ජාලය හා ධාරිතාවය පුළුල් වීම**

රටවල් 32 ක නගර 60 ක් ආවරණය වන පරිදි අපගේ ගුවන් මාර්ග ජාලය තුළ සිදුවූ වර්ධනය සමාලෝචිත වසර තුළ දැකගත හැකි විය. මෙම ව්‍යාප්තිය තුළ පැවති ප්‍රධාන අංග වූයේ, මොස්කව් නගරය දක්වා ගුවන් ගමන් දියත් කිරීමත්, සූරිච් නගරය කරා ගුවන් සේවා නැවත ආරම්භ කිරීමත්ය.

අපගේ ගෝලීය ගුවන් මාර්ග ජාලය තුළට කැනඩාවේ නගර අටක්ද, ඉන්දියාවේ නගර දෙකක්ද, පිළිවෙළින් එයා කැනඩා හා මිහින් ලංකා යන ගුවන් සමාගම් සමග එළඹි හවුල් සංකේත ගිවිසුම යටතේ, එකතුකර ගන්නා ලදි. ගමනාන්ත විශාල ප්‍රමාණයක් කරා ධාරිතාව ඉහළ නැංවීමද සිදු කරන ලදි. ඉන් වඩාත්ම සනිටුහන් කර දැක්විය හැක්කේ, ඉන්දියාවේ හා චීනයේ වෙළඳපලට අයත් ප්‍රධාන ගමනාන්ත කරා ගුවන් ගමන් වැඩි වාර ගණනාවක් ක්‍රියාවට නැංවීමයි.

අප සේවා ලාභීන්ගේ වැඩි පහසුව සඳහා අපගේ විදේශීය කාර්යාල කිහිපයක් පිහිටි ස්ථාන වලින් වෙනත් ස්ථාන කරා ගෙන යන ලද අතර, ගුවන් මගී සේවා නියෝජිත කාර්යාලයක් යාපනයේද විවෘත කරන ලදි.

**අපගේ ගුවන්යානා මගී මැදිරි වලට නව මුහුණුවරක් දීම**

සමාලෝචිත වර්ෂය තුළ අපගේ දිගු බඳ ගුවන් යානා ඇණිය ආශ්‍රිතව බොහෝ සැප පහසුකම් ගණනාවක් හඳුන්වාදීම මඟින් ගුවන් සමාගම සිය නිමැවුම් ප්‍රතිස්ථාපනය කිරීමේ වැදගත් වැඩසටහනක් උදෙසා මුල පිරීය. මෙහිලා ව්‍යාපාර පංතිය වෙත හඳුන්වා දුන් සමතල සයනාසන සහ ඉල්ලූ විට සැපයෙන ශ්‍රව්‍ය දෘෂ්‍ය රසාස්වාද පද්ධති යනාදිය ඇතුළත් විය.

ප්‍රතිනවීකරණයේ අධි පිරිවැය හේතුවෙන් කලක් තිස්සේ ප්‍රමාද වෙමින් පැවති මෙම වැඩසටහන තුළින් කලාපය ආශ්‍රිත ව්‍යාපාර පංති සතු විශිෂ්ටතම නිමැවුම් හා සමාන නිමැවුමක් අප සමාගමටද අත්කර ගත හැකි විය. මෙම ගුවන් යානා අපගේ ඇතැම් යුරෝපීය ගුවන් මාර්ග ඔස්සේ දැනටමත් සේවා සපයනු ලබන අතර අවසාන වශයෙන් 2012/13 වර්ෂය තුළ මෙම වැඩසටහන නිමවන විට, අපගේ සියලු දිගු බඳ ගුවන් සේවා අංශ තුළ අදාළ ගුවන් සේවා පහසුකම් ස්ථාපනය වනු ඇත.

**සේවා ඉටුකිරීම**

සේවා ඉටු කිරීමේ සියලු ක්ෂේත්‍ර අපගේ ගුවන් යානා ඇණියෙහි සහ ගුවන් ගමන් ජාලයේ ව්‍යාප්තියට හා නව මුහුණුවරට අනුගතව වැදගත් විස්තාරණයක් හා ප්‍රවර්ධනයක් අත් කර ගත්තේය.

මෙහි ලා සුවිශේෂී ප්‍රවණතාවයක් වනුයේ,ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් ව්‍යාපාර පංති මගීන් සඳහා සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා අධිකාරිය (ශ්‍රී ලංකා) විසින් පිරිනමනු ලබන විශේෂ 'සේද මාවත' ඔස්සේ ප්‍රවේශ වීමේ පහසුකම කිසිදු අමතර ගාස්තුවකින් තොරව දැන් ලබා ගත හැකි වීමයි. එම සේවා පහසුකම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් සේවා සලසා ගන්නා අනෙකුත් ගුවන් සමාගම් ඉක්මවා ලබන ව්‍යාපාර පංති අත්දැකීමක් වශයෙන් සුසැදේ.

**සේවාලාභීන්ගේ ප්‍රතිචාරය හා අන්තර් ක්‍රියාකාරිත්වය**

ගුවන් සමාගම මෙබඳු වැදගත් නවීකරණ ක්‍රියාවලියකට අවතීර්ණව සිටීමත් සමඟ අපගේ එවන් ආයෝජනයන්හි සාර්ථකත්වය කෙබඳු එකක්දැයි මැන බැලෙන අප සේවාලාභීන්ගේ අදහස් උදහස් ලබා ගැනීම මෙහි ලා අතිශයින් වැදගත් වේ. මගීන් වෙතින් ඔවුන්ගේ පැමිණිලි සහ ප්‍රශංසා ලබා ගැනීමේ ක්‍රමවේදයට අමතරව අප සමාගමේ නිමැවුම් හා සේවා පිළිබඳ සියලුම කරුණු සම්බන්ධයෙන් දැනුවත් වනු පිණිස අඛණ්ඩව මගී සමීක්ෂණ ක්‍රියාවලියක් සමාගම විසින් දියත් කරන ලදි.

වඩා පරිපූර්ණ හා සීමා විරහිත සේවා අත්දැකීමක් සලසා දෙනු පිණිස ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානයේ සේවා කටයුතුද තවදුරටත් පුළුල් කෙරිණි.

**ශ්‍රී ලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය**

හම්බන්තොට, මහනුවර හා ත්‍රිකුණාමලය යන ස්ථාන වල ගුවන් භාණ්ඩ විකුණුම් නියෝජිත කාර්යාල විවෘත කිරීම මගින් ශ්‍රී ලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය සිය ප්‍රවේශකත්වය දිවයින පුරා ව්‍යාප්ත කර හරින ලදි.

සමාගමේ ලෝක ව්‍යාප්ත ගුවන් භාණ්ඩ මෙහෙයුම් කටයුතු වඩාත් සවිමත් සම්බන්ධීකරණයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා එම කාර්යභාරය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පිහිටි ගුවන් භාණ්ඩ මධ්‍යස්ථානයේ මධ්‍යගත පාලනය යටතට පමුණුවන ලදි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ගුවන් භාණ්ඩ මධ්‍යස්ථානය සේවාලාභීන් වෙත අගය ආරෝපිත සේවා සැලසීමේ හා සේවා ඵලදායකත්වය ඉහළ නැංවීමේ ස්වකීය ක්‍රියාවලිය නොකඩවා පවත්වාගෙන යන ලද අතර සමීප පරිපථ දසුන් සහිත (CCTV)ආරක්ෂක කැමරා පද්ධතියක්, බා කෝඩ් හා පිරික්සුම් ස්කැනර් යන්ත්‍ර පද්ධතියක්, ගුවන් ප්‍රේෂණ වල බර කිරීමේ ස්වයංක්‍රීය පද්ධතියක් හා තට්ටු හයක භාණ්ඩ ඇසුරුම් පද්ධතියක් ඇතුළු බොහෝ නව පහසුකම්ද හඳුන්වා දෙන ලදි.

හම්බන්තොට ගුවන් තොටුපළෙහි පිහිටි ගුවන් භාණ්ඩ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සඳහාද ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය ඊට අදාළ මූලික කාර්යයන් ඉටුකිරීමෙහි දැනට නිරතව සිටී.

**ශ්‍රී ලංකන් සමාගමේ ඉංජිනේරු අංශය**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් ගුවන් යානා ඇණියෙහි මෙන්ම අනෙකුත් සේවාලාභී ගුවන් සමාගම් වලට අයත් ගුවන්යානා වලද ඒවායේ සිරිත් ප්‍රකාර නඩත්තු කටයුතු සහ ප්‍රධාන ඉංජිනේරුමය වැඩසටහන් ඉටු කළ ශ්‍රී ලංකන් සමාගමේ ඉංජිනේරු අංශය තම කටයුතුවල අතිසාර්ථකම වර්ෂය සමාලෝචිත වසර තුළ සනිටුහන් කළේය.

මේ අතුරින් වඩාත්ම භාරදූර ව්‍යාපෘතිය වූයේ අපගේ ගුවන් යානා ඇණියේ දිගුබඳ යාත්‍රාවල මගී මැදිරි උත්ශ්‍රේණිගත කිරීමයි. මවිසින් මේ පිළිබඳව විස්තර ඉහත දක්වා ඇත.

ඉන්දියාවට අයත් විශාලතම අඩුගාස්තු ගුවන් ප්‍රවාහකයා වන ඉන්ඩිගෝ ගුවන් සමාගම නොකඩවා සිව්වන වසරටද ඔවුන්ගේ A320 වර්ගයට අයත් එයාර් බස් ගුවන් යානා ආශ්‍රිත ප්‍රධාන සී චෙක් නැමැති පරීක්ෂණ නඩත්තු කටයුතු ඉටු කිරීම පිණිස අප හා ගිවිසුමකට එළඹීමත් සමඟම නඩත්තුව, අලුත්වැඩියාව හා පිළිසකර කිරීම යන ක්‍රමවේදත්‍රයෙන්ම සමන්විත කලාපයේ ප්‍රධාන MRO පහසුකම් සපයන්නා ලෙස පත්වීමේ ස්වකීය ප්‍රයත්නය කෙරෙහි වැදගත් බලගැන්වීමක් ශ්‍රී ලංකන් සමාගමේ ඉංජිනේරු අංශය අත්කර ගත්තේය. එහිලා තව දුරටත් වැදගත් සේ සැලකෙනුයේ, ඉන්ඩිගෝ ගුවන් සමාගම විසින් ශ්‍රී ලංකන් ඉංජිනේරු අංශය වෙත සේවා කටයුතු සඳහා ඉකුත් වර්ෂයේදී එවන ලද ගුවන් යානා 20 එල්ලේ මෙම වසර තුළ ගුවන් යානා 27 ක් එවමින් ඔවුන් විසින් එවන ලද යාත්‍රා සංඛ්‍යාවේ ඉහල නැංවීමක් සනිටුහන් කිරීමයි.

A320 වර්ගයේ ගුවන් යානා සඳහා විශේෂයෙන් වෙන් වූ ගුවන් යානාගාරයක් බවට පැරණි ගුවන් යානාගාරය නවීකරණය කර පරිවර්තනය කිරීම මගින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ශ්‍රී ලංකන් ඉංජිනේරු අංශයේ පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා වූ වැදගත් ආයෝජන සිදු කිරීමේ කාර්යයෙහි ශ්‍රී ලංකන් ගුවන් සමාගම දැන් නිරතව සිටියි. A320ගුවන් යානා වර්ගය අද මෙම කලාපය තුළ වඩාත් බහුලවම භාවිතයට ගැනෙන ගුවන් යානා වර්ගය හෙයින් සමාගමේ ආයෝජන මත කඩිනම් ලාභදායිත්වයක් අත්වෙතැයි එමගින් අපේක්ෂා කෙරේ.
ගුවන් යානා නඩත්තු, අලුත්වැඩියා හා පිළිසකර කිරීමේ (MRO) කලාපීය මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව පත් කිරීමේ රජයේ දැක්ම තුළ වැදගත් කාර්ය භාරයක් ශ්‍රී ලංකන් ඉංජිනේරු අංශය ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරන අතර හම්බන්තොට ගුවන් තොටුපළෙහිද අදාළ පහසුකම් ස්ථාපනය කෙරෙනු ඇත.

### ශ්‍රී ලංකන් සමාගමේ ගුවන් ටැක්සි සේවය

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකන් සමාගමේ ගුවන් ටැක්සි සේවය සිය යටිතල පහසුකම් හා ගුවන් ගමන් මාර්ග ජාලය සැලකිය යුතු අයුරින් වැඩිදියුණු කර ගත්තේය.

මෙම කාර්යයෙහි ලා අතිශයින් වැදගත් සිදුවීමක් වූයේ දඹුගම් ඔය ආශ්‍රිතව ප්‍රධාන ජලතොටක් ස්ථාපනය කිරීමයි. බණ්ඩාරනායක ගුවන් තොටුපළට විනාඩි 15 ක දුරින් එය පිහිටා තිබීම නිසා ජාත්‍යන්තර සංචාරකයන් හට සාපේක්ෂ වශයෙන් සීමාරහිත වූ සම්බන්ධන හැකියාවක් එමගින් සැලසේ.

ශ්‍රී ලංකන් ගුවන් ටැක්සි සේවය එහි සේවා දඹුල්ල, ත්‍රිකුණාමලය, ඉරණමඩු හා මඩකලපුව යන ස්ථාන කරා ව්‍යාප්ත කරන ලද අතර බොහෝ දුරට මුළු රටම ආවරණය කෙරෙන ගුවන් මාර්ග ජාලයක් තමන් සතුව ඇතැයි තෘප්තිමත් වීමට ශ්‍රී ලංකන් ගුවන් ටැක්සි සේවයට දැන් පුළුවන.

### "ෆ්ලයිස්මයිල්ස්" නිරන්තර පියසර වැඩසටහන

'යංග්ස්මයිල්ස්' නැමැති වැඩසටහනක් දියත් කර 'ෆ්ලයිස්මයිල්ස්' ක්‍රමය ව්‍යාප්ත කරමින් සමාගම ප්‍රමුඛ ගෝලීය හා දේශීය වෙළඳ සන්නාම සමඟ හවුල් ගිවිසුම් වලට එළඹියේය.

ලෝව්‍යාප්ත සාමාජිකත්වයේ වැඩිවීමක් සහිතව සමාගම විසින් සමාලෝචිත වසර තුළ විශේෂයෙන් වයස අවුරුදු 18 ට අඩු ළමුන් වෙනුවෙන් සකසන ලද නව උප වැඩසටහන වන යංග්ස්මයිල්ස් ක්‍රමය 'ෆ්ලයිස්මයිල්ස්' නැමැති ප්‍රධාන වැඩසටහනට අතිරේකව ක්‍රියාත්මක කරන ලදි.

### ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කාර්මික පුහුණුව

A320, A330සහA340 යන වර්ග වලට අයත් එයාර් බස් ගුවන් යානා පවුලේ යාත්‍රා ආශ්‍රිත ගුවන් යානා විද්‍යුත් හා යාන්ත්‍රික ධාරා තාක්ෂණය සහ මාදිලි භාවිතා පුහුණුව යන ක්ෂේත්‍රද්වයේම පුහුණුව සලසා දීම සඳහා වූ යුරෝපීය ගුවන් සේවා ආරක්ෂක නියෝජිත ආයතනයෙන් නිකුත් කරනු ලබන EASA 147සහතිකය දිනා ගැනීමට සමත් වූ ආසියාතික කලාපයේ පිහිටි ඉංජිනේරු පුහුණු ආයතන සුළු ප්‍රමාණයක් අතරින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කාර්මික පුහුණු අංශය එක් ආයතනයක් වන්නේය. පාකිස්ථානය, මාලදිවයින හා ශ්‍රී ලංකාව ඇතුලු කලාපයේ රටවල් කිහිපයක සිවිල් ගුවන් සේවා බලධරයන් විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කාර්මික පුහුණු ආයතනය පිරිනමනු ලබන වැඩසටහන් සහතික කරනු ලැබ තිබේ.

### ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පියසර විද්‍යායතනය

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 ඔක්තෝම්බර් මස 20 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පියසර විද්‍යායතනය ස්ථාපිත කිරීම මගින් අප සමාගමේ වැදගත් සංවර්ධනාත්මක පියවරක් සනිටුහන් වූ අතර කලාපීය ගුවන් සමාගම් වල පුහුණු කේන්ද්‍රස්ථානය ලෙසට ශ්‍රී ලංකාව පත්වීමේ නැඹුරුව එමගින් තහවුරු කළේය.

මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ ලොක්හීඩ් මාටින් සමාගමේ ආයතනයක් වන නෙදර්ලන්තයේ සිම් ඉන්ඩස්ට්‍රීස් බී.වී. ආයතනය අතර එළඹි දස අවුරුදු හවුල් ව්‍යාපාර ගිවිසුමක ප්‍රතිඵලයකි. A320 වර්ගයේ එයා බස් ගුවන් යානා මෙහෙයුම් කාර්යයෙහි ලා නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකන් සහ සිම් ඉන්ඩස්ට්‍රීස් යන සමාගම්ද්වයම විසින් අදාළ ගුවන් යානා "සිමියුලේට" අනුකාරක යන්ත්‍රය කලාපය තුළ අලෙවියට තැබේ.

**තාක්ෂණය**

පශ්චිමාන්ත පද්ධති, ආයතනික වෙබ් අඩවිය, සේවා කලින් වෙන්කරගැනීමේ අන්තර්ජාල යාන්ත්‍රනය සහ ගෝලීය ඇමතුම් මධ්‍යස්ථානය යනාදිය සඳහා වැඩිදියුණු කිරීම් රාශියක් සහිතව තාක්ෂණ ක්ෂේත්‍රය තුළ වැදගත් පියවර ගණනාවකට මුල පිරිණි. මෙම වාර්තාවෙහි අන් තැනෙකද සඳහන් පරිදි, අපගේ තොරතුරු තාක්ෂණ අංශය සමාලෝචිත වසර තුළ එකිනෙකට වෙනස් ජාත්‍යන්තර ප්‍රමිති සහතික (ISO) දෙකක් දිනා ගන්නා ලදි.

**ජනතා අධ්‍යයනය හා සංස්කෘතිය**

මානව සම්පත් කළමනාකරණ සංවර්ධනය හා එය ඵලදායී ලෙස යොදා ගැනීම යන ක්ෂේත්‍රය, ව්‍යාපාරික අරමුණු වලට උපස්ථම්භක වන්නා වූ මානව සම්පත් කටයුතු සමඟ ප්‍රතිසම්බන්ධනය කරමින් නව මුහුණුවරක් ගන්වන ලදි. සමාගමේ ප්‍රගතියෙහි ලා ඵලදායිතාවය රඳවා ගැනීම හා සේවක පිරිස් සහභාගි කරවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කෙරෙන හවුල් ව්‍යාපාරික කාර්යභාරයක් මානව සම්පත් කටයුතු තුළට ආරෝපණය කෙරෙනි. ඊට අදාළ කරුණු කීපයක් මෙහි පහත ගෙනහැර දක්වමු.

- එක් එක් අංශයට හවුල් ව්‍යාපාර නිශ්චිත කාර්යභාර පවරමින් මානව සම්පත් කළමනාකරණ සංවර්ධන අංශය ප්‍රතිව්‍යුහගත කිරීම.
- ප්‍රධාන විධායක නිලධාරිවරයා හා ජ්‍යෝෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් සහභාගි කරගනිමින් සවන් දීමේ වැඩසටහන් දියත් කිරීම. එහිදී සේවක සේවිකාවන්ගේ යෝජනා හා අදහස් සැලකිල්ලට ගන්නා ලද අතර අනවබෝධය හා වැරදි ආකල්ප දුරු කර සේවක පිරිස් වල සහාය සලසා ගැනීම සඳහා සමාගමේ අනාගත සැලසුම් සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම බෙදා ගන්නා ලදි.
- ආදායම වැඩිකර ගනිමින් පිරිවැයෙන් උපරිම වාසි සලසා ගැනීමටත්, නාස්තිය පිටු දැකීමටත්අවශ්‍ය වන්නා වූ යෝජනා පහළ ස්ථරවල සිට ඉහළ ස්ථර දක්වා දිවෙන සේවක සේවිකාවන් වෙතින් ලබා ගැනීම පිණිස ඒකාබද්ධ දින හා ඵලදායිතා සභා ස්ථාපනය කිරීම.
- ජන උද්යෝගය ඇති කර ඔවුන් තුළ තරඟකාරීත්වය පිළිබඳ නැඹුරුවක් ඇති කිරීම සඳහා වසර කීපයක ඇවෑමෙන් ක්‍රීඩා සභාව සහ තරඟකාරී ක්‍රීඩාවන්හි නියැලීම නැවත පුනර්ජීවනයට හසු කරන ලදි.
- මාසිකව විවෘත මානව සම්පත් දිනයක් ආරම්භ කරන ලද අතර එහිදී කාර්ය මණ්ඩලයේ ඕනෑම මට්ටමේ සාමාජිකයෙකුට කළමනාකරණය මුණගැසී තම ගැටළු ඉදිරිපත් කිරීමේ හා අදාළ කරුණු සම්බන්ධයෙන් සිය මතය ප්‍රකාශ කිරීමේ අවස්ථාව සලසා දෙන ලදි.

සමාගමට අයත් පුහුණු කටයුතු ඉටු කිරීමේ හස්තය වන ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය, හඳුනාගත් පුහුණු හා සංවර්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් සමාගමේ සියළුම කාර්ය මණ්ඩල වලට රැකියා කුසලතා නංවා ගැනීමේ හා සංවර්ධනය කර ගැනීමේ නැඹුරුවක් සහිත ඉලක්කගත අධ්‍යයන සහ අභ්‍යාස වැඩසටහන් මෙහෙයවයි.

**ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය**

දකුණු ආසියාවේ විශිෂ්ටතම පුහුණු මධ්‍යස්ථාන දහයෙන් එකක් බවට ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන නියෝජිතායතනය විසින් නම් කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පුහුණු ආයතනය ලෙස එම විද්‍යායතනය ස්වකීය තත්ත්වය වඩාත් තහවුරු කර ගත්තේය.

ජාත්‍යන්තර ගුවන් සේවා වැඩසටහන් මෙහෙයවීමේ කලාපීය පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන්ද, මාලදිවයිනෙහි තම එකම පුහුණු හවුල්කරු වශයෙන්ද, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන නියෝජිතායතනය විසින් පිළිගන්නා ලද දකුණු ආසියාවේ ප්‍රථම පුහුණු ආයතනය බවට ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය පත්විය. ජාත්‍යන්තර ගුවන්සේවා විද්‍යායතනය විසින් සිය ප්‍රථම විදේශීය වරලත් ශාඛා ආයතනය 2012 වසර තුළදී ස්ථාපනය කිරීමට නියමිතය.

**ආයතනික සමාජ වගකීම**

ආයතනික සමාජ වගකීම පිළිබඳ ස්වකීය දිගුකාලීන සම්ප්‍රදාය අනුව කටයුතු කරමින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ එහි අනුබද්ධ ආයතනය වන ශ්‍රී ලංකන් කේටරින් සමාගම ආයතනික මෙන්ම එක් එක් දෙපාර්තමේන්තු යන මට්ටම්ද්වයම මගින් පුළුල් පරාසයක විහිද යන ව්‍යාපෘති මාලාවක් සඳහා උරදුන් අතර ඒවා අතර පහත සඳහන් කටයුතු අන්තර්ගත විය.

- උතුරු පළාතේ ළමා පිළිකා රෝහලක් ඉදිකිරීම පිණිස ඇ.ඩො. මිලියන 02 ක අරමුදල් ප්‍රමාණයක් සපයා ගැනීමේ අරමුණෙන් අරඹා ඇති දීප ව්‍යාප්ත “ද ට්‍රේල්” (මං සලකුණ) නැමැති ව්‍යාපෘතියට ආධාර සලසා දෙන ලදි.
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ වයෝවෘද්ධ පුද්ගලයන්ගේ ප්‍රයෝජනය පිණිස අන්තර් අක්ෂිකාච ප්‍රදානය කරන ලදි.
- අපගේ අනුබද්ධ සමාගම වන ශ්‍රී ලංකන් කේටරින් සමාගම රු.මි. 7.5 ක් වැය කොට ආඬිඅම්බලම බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයට සිසුන් 300 ක් සඳහා වූ පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර දෙන ලදි.

**ඉදිරි වර්ෂයේ සමස්ථ උපායමාර්ග**

ආදායම් උත්පාදනය ඉහළ නංවාගැනීම සඳහා වැඩි මාවත් ප්‍රමාණයක් විවරකර ගැනීම සඳහාත්, අලාභ අඩු කර ගැනීම පිණිස ව්‍යාපාර කාර්ය ඒකක විවිධාංගීකරණයට හසු කිරීම සඳහාත් වන අවස්ථාවලින් උපරිම ඵල නෙලා ගැනීම උදෙසා පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කිරීම අපගේ අපේක්ෂාවයි.

- මැදපෙරදිග, ඉන්දියානු උප මහද්වීපය සහ ඈත පෙරදිග යන කලාප වල ලාභදායී ගුවන් මාර්ගවල ගමන් වාර ගණන සහ ධාරිතාවය ඉහළ නංවාගන්නා අතරම සැලකිය යුතු අධික පිරිවැයක් සහිත යුරෝපීය කලාපයේ ධාරිතාවය විධිමත් කිරීම. දැනට යුරෝපය පුරා පැතිර යන ආර්ථික අර්බුදයේ පසුබිම අනුව යුරෝපීය කලාපය වෙතින් සිදුවන සංවර්ධනයේ පහත වැටීමක් සිදුවිය හැකි බැවින් මෙය විශේෂයෙන් මනෝඥ වේ.

- ගාස්තු ව්‍යුවහයන්හි වරණීය ඉහළ දැමීම් ඔස්සේ ලාභදායකත්වය ඉහළ නංවා ගනිමින් ආදායම් කළමනාකරණය සවිමත් කිරීම සඳහා අවධානය යොමු කිරීම.

- දිගු ඈදි ගුවන් මාර්ග වල සේවය පිණිස ප්‍රමාණවත් ගුවන්යානා ප්‍රමාණයක් යොදවා ඒවා උත්ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ විට අපගේ අධිශ්‍රේණි ව්‍යාපාරික පංති නිමැවුම මත වාසිදායක තත්ත්වයක් උදා කර ගැනීම හා එකී ව්‍යාපාරික පංති විකුණුම් උපරිම අයුරින් පවත්වා ගැනීම.

- දකුණු කොරියාවේ සෝල් නුවර කරා නව ගුවන් සේවයක් දියත් කිරීම.

- අනෙකුත් ගුවන් සමාගම් සමඟ අපගේ හවුල් කේත සබඳතා සවිමත් කිරීම හා අප විසින් සේවා ක්‍රියාත්මක නොකරන කලාපය තුළ පිහිටි වැඩි ගුවන් සමාගම් ගණනාවක් සමඟ හවුල් කේත ගිවිසුම් වලට එළඹීම ඔස්සේ අපගේ ගෝලීය ගුවන් මාර්ග ජාලය තවදුරටත් ව්‍යාප්ත කර ගැනීම.

- විශේෂයෙන් කේන්ද්‍රීය වෙළඳපළ වෙතින් ශ්‍රී ලංකාව වෙත වැඩි සංචාරකයන් පිරිසක් ගෙන්වා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචාරක ආයතනය හා රටේ ආගන්තුක හා විනෝදාස්වාද කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ අපගේ හවුල්කාරිත්වය තවදුරටත් විස්තාරණයට හසු කිරීම.

- භාවිතයට නොගත් ගුවන්යානාගාරයක් පිළිසකර කර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ A320 වර්ගයේ ගුවන්යානා වලට සුවිශේෂී වූ ගුවන් යානාගාරයක් ඉදිකිරීම සඳහා මුදල් ආයෝජනය කිරීම.

- අනෙකුත් ගුවන් සමාගම් සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ඉංජිනේරු අංශයේ තෘතීය පාර්ශව ගුවන්යානා නඩත්තු ව්‍යාපෘති පුළුල් කිරීම.

- දැනට අලාභ පිට පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් ටැක්සි සේවයට නව මුහුණුවරක් දීම සඳහා ඊට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ගුවන් සමාගම් ආශ්‍රිත ව්‍යාපාර පුළුල් කිරීම පිණිස වූ ගොඩබිම් හා ගුවන් භාණ්ඩ මෙහෙයුම් උපකරණ හා පහසුකම් සඳහා සහ හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා මුදල් ආයෝජනය කිරීම.

- ගුවන් නියමු පුහුණුව සඳහා වඩාත් අංගසම්පූර්ණ නිමැවුමක් අලෙවි කිරීමට මෙන්ම ස්වකීය පුහුණු කටයුතු වල වියදම් අඩු කර ගැනීමටද සමාගමට හැකිවනු පිණිස A330 වර්ගයේ ගුවන් යානා සඳහා පූර්ණ ගුවන්යානා සිමියුලේටර් දෙවන අනුකාරකයක් වෙනුවෙන් මුදල් යෙදවීම.

- ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යාතනය විසින් සලසා දෙනු ලබන බාහිර පුහුණු වැඩසටහන් වැඩි කිරීම.

- අපගේ ගුවන් යානාස්ථ තීරුබදු රහිත විකුණුම් ඔස්සේ උපරිම වාසි සලසා ගැනීම.

- ආදායම් වැඩිකර ගැනීම සඳහා මිහින් ලංකා ගුවන් සමාගම සමඟ පවත්නා අපගේ හවුල්කාරිත්වයට අදාළ සහසම්බන්ධතාවය සවිමත් කර ගැනීම.

- ගෝලීය ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ නව ප්‍රවණතා හා සම මට්ටමකින් යුතුව අප සමාගමේද විධික්‍රම හා පද්ධති පවත්වා ගැනීම සඳහා මුදල් ආයෝජනය කිරීම.

**අනාගත මතු අපේක්ෂා**

සමාලෝචිත වසර තුළ ප්‍රකාශිත ප්‍රාග්ධනයේ සිව් වැදෑරුම් ඉහළයාමකට ඉවහල් වූ ශ්‍රී ලංකා රජය විසින් ලබාදුන් ප්‍රාග්ධන සැපයුම හා ශ්‍රී ලංකා රජය විසින් ඉදිරි සිව් වසර තුළ සැලසුම් කර ඇති ප්‍රාග්ධන සැපයුම තුළින් සනිටුහන් වනුයේ අප සමාගමේ වර්ධනයට අනුබල දෙමින් එය තිරසාරව පවත්වාගෙන යාම සඳහා වන ශ්‍රී ලංකා රජයේ කැපවීමයි.

**ස්තුතිය**

පුනර්ජීවනයේ වර්ෂය ශ්‍රී ලංකන් ගුවන් සමාගම විෂයෙහි පහසු එකක් නොවූ අතර එය යථාර්ථයක් බවට පත්කළ බොහෝ පුද්ගලයන්ට මෙන්ම ආයතන වලටද මම මාගේ කෘතවේදීත්වය පිරිනමමි.

අතිගරු ජනාධිපතිතුමාටද, ශ්‍රී ලංකා රජයටද, ඔවුන්ගේ අඛණ්ඩ අනුබලයට හා සහයෝගයට ස්තුතිවන්ත වෙමි.

දැක්වූ මාර්ගෝපදේශකත්වය සහ සහය වෙනුවෙන් සභාපතිතුමාටද, අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් මගේ සොහොයුරු සාමාජික සාමාජිකාවන්ටද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමටද මාගේ තුති ප්‍රණාමය හිමිවේ.

අඛණ්ඩ කැපවීමක් හා වෙහෙසකර සේවයක් තුළින් කටයුතු කරමින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සියලු දෙනා එකම පවුලක් වශයෙන් සාමූහිකව අත්වැල් බැඳගත් සියළුම සේවක පිරිස් වලටත්, සේවක සංගම් වලටත් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අප හා උරෙනුර ගැටෙමින් කටයුතු කළ ආයතන බොහෝය. විදේශික හා ශ්‍රී ලාංකික අපගේ මූල්‍ය සැපයුම්කරුවන්, ශ්‍රී ලංකා සංචාරක ආයතනය, සී/සගුවන් තොටුපළ හා ගුවන් සේවා අධිකාරිය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ක්‍රියාත්මක වන සියලු ගුවන් සමාගම්, අපගේ සැපයුම්කරුවන් හා ව්‍යාපාරික හවුල්කරුවන්, ඒ සැමටත් වඩා අපගේ මහඟු සේවා ලාභීන් යනාදී සැම සියලු පාර්ශවකරුවෙකුගේම අනුග්‍රාහකත්වය මෙහි ලා අපගේ ඇගැයුමට ලක්වේ.

**අ/කළේ: කපිල චන්ද්‍රසේන**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි**

**2012.08.17**

## අධ්‍යක්ෂවරුන්ගේ කාර්යසාධන සටහන

### නිශාන්ත වික්‍රමසිංහ මහතා

2006 ජනවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. 2008 අප්‍රියෙල් මාසයේදී විධායකඅධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන්නට යෙදුණි. 2008 සැප්තැම්බර් මාසයේදී වැඩ බලන සභාපතිවරයා වශයෙන්ද, 2009 ජූනි මස සිට සභාපතිවරයා ලෙසද පත් කෙරිණි. සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සහ සීමාසහිත මිහින් ලංකා යන සමාගම්වල සභාපතිවරයාද වන වික්‍රමසිංහ මහතා උඩුපුස්සැල්ලාව වැවිලි සමාගමේද, හපුගස්තැන්න වැවිලි සමාගමේද අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

### කපිල චන්ද්‍රසේන මහතා

2008 දෙසැම්බර් මාසයේදී අධ්යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. ඊට අමතර වශයෙන් 2011 අගෝස්තු මාසයේදී ප්‍රධාන විධායක නිලධරයා ලෙසද පත්කෙරිණි. වෘත්තිමය අලෙවිකරුවෙකු වන චන්ද්‍රසේන මහතා දැනට සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද සී/සමිහින් ලංකා (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙසද කටයුතු කරයි.

### නිහාල් ජයමාන්න මහතා, ජනාධිපති නීතිඥ

1994-98 කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුව සිට පසුව 2008 සැප්තැම්බර් මාසයේදී නැවත පත් විණි. ජනාධිපති නීතිඥවරයෙකු වන ඒ මහතා වසර 40 කට අධික නීතිඥ වෘත්තියේ පළපුරුද්දක් ඇත්තකු වන අතර ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ සහ සමාගම් පනත පිළිබඳ උපදේශක කොමිෂන් සභාවේ සභාපති වරයාද වේ. ජයමාන්න මහතා සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ සහ සෙලාන් බැංකු සමාගමේ අධ්‍යක්ෂවරයෙකුද වේ.

### ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා

අධ්‍යක්ෂවරයෙකු වශයෙන් 2009 අගෝස්තු මාසයේදී පත් කෙරිණි. පරිගණක ඉංජිනේරු වෘත්තිකයෙකු වන රාජපක්ෂ මහතා ගරු මුදල් ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් ධූරය දැනට හොබවයි. ඒ මහතා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේද, සී/ස එස්.එල්.ටී. හොංකොං සමාගමේද, සී/ස එස්.එල්.ටී. පබ්ලිකේෂන්ස්(පුද්ගලික) සමාගමේද, සී/ස ශ්‍රී ලංකා කේටරින් සමාගමේද අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි.

### මනිලාල් ප්‍රනාන්දු මහතා

2010 මැයි මාසයේදී අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදි. සී/ස හොල්සිම් ලංකා සමාගමේ සභාපති ධූරය දැනට හොබවයි. වෘත්තියෙන් නීතිවේදියෙකු වන ඒ මහතා සමාගම් කිහිපයකම අධ්‍යක්ෂ පදවි දරන අතර, සී/ස ඒට්කන් ස්පෙන්ස් සහ සමාගම, සිලෝන් ඉන්වෙස්ට්මන්ට් සමාගම සහ සී/ස ෂිපිං ඇන්ඩ් කාගෝ ලොජිස්ටික්ස්(පුද්ගලික) සමාගම ඉන් කිහිපයකි.

**ලක්ෂ්මී සංගක්කාර මහත්මිය**

2011 සැප්තැම්බර් මාසයේදි අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදි. ඇය මණ්ඩලීය විගණන කමිටුවේද සාමාජිකාවකි. වෘත්තියෙන් නීතිවේදිනියක වන ඇය පීපල්ස් ට්‍රැවල්ස් සමාගමේ සභාපති ධූරය සහ මහජන බැංකුවේ අධ්‍යක්ෂ ධූරයක්ද හොබවයි.

**සනත් උක්වත්ත මහතා**

2004-2008 කාලය තුළද, 2008-2010 කාලය තුළද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටි උක්වත්ත මහතා ඉන් අනතුරුව 2011 සැප්තැම්බර් මස සිට අද දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි. වෘත්තියෙන් හෝටල්කරුවකු වන ඒ මහතා දැනට මවුන්ට්ලැවීනියා හෝටල් සමූහයේ සභාපතිවරයා වේ. මණ්ඩලීය විගණන කමිටුවේ සාමාජිකයෙකු වන උක්වත්ත මහතා සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වේ.

**සුසන්ත රත්නායක මහතා**

2011 දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. මණ්ඩලීය විගණන කමිටුවේ සභාපතිවරයාද වන රත්නායක මහතා සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමේද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි. දැනට ජෝන් කීල්ස් හෝල්ඩිං සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී යන පදවි දරන ඒ මහතා ජෝන් කීල්ස් හෝල්ඩිං ව්‍යාපාර සමූහයේ ලැයිස්තුගත කළ හා නොකළ වෙනත් සමාගම් කිහිපයකද එම පදවි හොබවයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂ 2012 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්වකීය වාර්ෂික වාර්තාව මෙහි ලා ඉදිරිපත් කර සිටිනුයේ සතුටිනි.

### ප්‍රධාන කටයුතු හා ව්‍යාපාර කාර්ය සමාලෝචනය

සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් වනුයේ ශ්‍රී ලංකාවේ නම්කළ ගුවන් ප්‍රවාහකයා වශයෙන් ගුවන් මගීන්, ගුවන් බඩු හා ගුවන් තැපැල් ප්‍රවාහනය කිරීම සඳහා වන ජාත්‍යන්තර ගුවන් සේවා හා නිශ්චිතව කාලසටහන් ගතකළ /නොකළ ගුවන් සේවා ක්‍රියාත්මක කිරීමය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිතව ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන්යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ වර්ග විකිණීම, රට අභ්‍යන්තර හා ඉන් පරිභාහිර නිවාඩු ගත කිරීමේ සහනදායී සැලසුම් අලෙවි කිරීම සහ මගී ප්‍රවාහනය සඳහා අභ්‍යන්තර ගුවන් ටැක්සි සේවා ක්‍රියාත්මක කිරීම යන කටයුතු සමාගමේ අනෙකුත් ප්‍රධාන කාර්යයන්හි ලා ගැනේ. සමාගම විසින් ඉටු කරනු ලබන සහායක කර්තව්‍යයන් අතර තෘතීය පාර්ශව නඩත්තු කටයුතු සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සැපයීම හා ගුවන් සේවා ආශ්‍රිතව පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය වේ.

සමාගමට අයත් කර්තව්‍යන්හි ස්වභාවය සම්බන්ධයෙන් වූ වැදගත් වෙනස්කම් කිසිවක් මූල්‍ය වර්ෂය තුල සිදු නොවීය.

ව්‍යාපාර සමූහය සමන්විත වනුයේ සමාගම සහ සමාගම විසින් පූර්ණ අයිතිය හොබවන අනුබද්ධ ආයතනයක් වූ සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම යන ආයතනද්වයෙනි. සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමට අයත් ප්‍රධාන කර්තව්‍ය වනුයේ ශ්‍රී ලංකාවේ කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් සඳහා ගුවන් යානාස්ථ ආහාර පාන සැපයුම් සලසා දීමය.

### මූල්‍ය ප්‍රකාශ හා විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය අංශයේ ප්‍රධානියා සහ අධ්‍යක්ෂවරුන් විසින් විධිමත් පරිදි අත්සන් තබන ලද 2012 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛන හා ඒ පිළිබඳව විගණකවරයාගේ වාර්තාව මේ වාර්තාවට අමුණා ඇත.

### ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති අංක 37-40 දක්වා වූ පිටුවල සඳහන් වේ.

**සමූහයේ පිරිවැටුම**

සමූහයට අයත් පිරිවැටුම් ප්‍රමාණයරු. මි.92,257 ක්වශයෙන් ගණනය විය. (2010/11: රු. මි.78,515 )සමූහයේ පිරිවැටුම් පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 17 වන සටහනෙහි දැක්වේ.

සමාගම සහ සමාගමේ පූර්ණ අයිතිය හිමි අනුබද්ධ ආයතනයක් වූ සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම අතර සිදුවන ගණුදෙනු සාධාරණ වෙළඳපළ මිල ගණන් අනුව ඉටුවේ.

**ප්‍රතිඵල**

බදු ගෙවීමට පෙර සමූහයේ ප්‍රතිඵලය රු.මි.17,161ක ඌනතාවයක් වශයෙන් ගණනය විය. (2010/11:සමූහයේ ඌනතාවය රු. මි.177). බදු සඳහා රු. මි.11ක ප්‍රමාණයක් (2010/11:රු.මි.26) ගළපනු ලැබීමෙන් පසුව වර්ෂය සඳහා සමාගමේ ප්‍රතිඵලය රු. මි.17,172කි. (2010/11: සමූහයේ ඌනතාවයරු. මි.202කි)

වසර සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය පිටු අංක 34 හි දැක්වේ.

**සමූහයේ ආයෝජන**

වසර තුළ සමූහය සඳහා වූ දේපළ, පිරියත සහ උපකරණ ආශ්‍රිත ප්‍රාග්ධන වියදම රු. මි.2,692ක් වශයෙන් ගණනය විය. (2010/11:රු. මි.909)

**දේපළ, පිරියත සහ උපකරණ**

ශේෂ පත්‍රයේ දිනට සමූහයට අයත් දේපළ, පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගයරු. මි.7,238 ක් වශයෙන් ගණනය විය. (2010/11:රු. මි.4,648). දේපළ, පිරියත සහ උපකරණ හා ඒවායේ සංචලනය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 3 වන සටහනෙහි දක්වා ඇත.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මි. 19,433ක් වශයෙන් ගණනය වේ. (2010/11: රු. මි. 5,146)

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් භාණ්ඩාගාර බැඳුම්කර අනුසාරයෙන් වූ රු. මි. 14,286ක් වූ කොටස් ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇත. හිමිකම් නිකුතුවක අනුසාරයෙන් සාමාන්‍ය කොටස් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව බලය ප්‍රදානය කර ඇත. මෙම කොටස් නිකුත් කිරීම සඳහා වන කොටස් හිමියන්ගේ අනුමැතිය එළඹෙන මූල්‍ය වර්ෂය තුළ පැවැත්වෙන අතිවිශේෂ මහසභා රැස්වීමකදී ඉල්ලා සිටිනු ඇත.

**සංචිත**

2012 මාර්තු මස 31 වන දිනට සමූහයේ මුළු සංචිත ප්‍රමාණය සෘණ රු. මි. 15,279ක් වශයෙන් ගණනය වේ. (2010/11: රු. මි. 1,156)රු. මි. 17,856ක් වූ සමුච්චිත අලාභයක්ද (2010/11: සමුච්චිත ලාභය රු. මි. 684), රු. මි. 2,523ක් වූ ප්‍රාග්ධන සංචිත ප්‍රමාණයක්ද(2010/11: රු. මි. 1,786), රුපියල් මිලියන0.63ක් වූ ආදායම් සංචිත ප්‍රමාණයක්ද (2010/11: රු. මි. 0.63), රු. මි. 53ක් වූ පොදු සංචිත ප්‍රමාණයක්ද (2010/11: රු. මි. 53) මෙහි අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන කොටස් ආයෝජන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශයෙහි මෙම සංචිත ආශ්‍රිතව සිදුවූ සංචලනය නිරූපණය කර ඇත.

**ආයතනික ප්‍රදාන**

වසර තුළ සමූහය විසින් කිසිදු මුදල් ප්‍රදානයක් සිදු කර නොමැත. දේශපාලනමය අරමුණු සඳහා ප්‍රදාන කිසිවක්ද සිදු කර නැත.

**බදුකරණය**

සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ එළඹ ඇති ස්වකීය ගිවිසුම අනුව 2013 මාර්තු මස 31 වන දින දක්වා බදු විරාමයක් භුක්ති විඳියි. 2011 අංක 22 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2021 මාර්තු මස 31 වන දින දක්වා ස්වකීය සියලුම ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වූ සෑම බද්දකින්ම සමාගම නිදහස ලබා ඇත.

දැනට ශ්‍රී ලංකාව හා ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොකරන රටවල් වලදී සිදුකෙරෙන ස්වකීය එතෙර මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සමාගම බදු ගෙවනු ලැබීමට යටත් වේ.

සමාගමේ පූර්ණ අයිතිය සතු සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් අනුබද්ධ ආයතනය සම්බන්ධයෙන් සලකා බලන කළ, එය යානාස්ථ මුළුතැන් ගෙවල් වලින් සහ මාර්ගස්ථ අවන්හල් වලින් උපයන ආදායම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා බැඳුනු ගිවිසුම අනුව 2006 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බද්දෙන් නිදහස්ය.

වෙනත් ප්‍රභවයන් වෙතින් උත්පාදනය වන ආදායම සාමාන්‍ය බදු අනුපාත අනුව බදු ගෙවනු ලැබීමට යටත් වේ.

**කොටස් තොරතුරු**

2012 මාර්තු මස 31 වන දිනට කොටස් හා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| **කොටස් අයිතිය** | **කොටස්ගණන** | **හිමිකම් ප්‍රතිශතය** |
|---|---|---|
| ශ්‍රීලංකාරජය | 26,275,436 | 51.06% |
| ලංකාබැංකුව | 12,115,570 | 23.54% |
| මහජනබැංකුව | 4,236,135 | 8.23% |
| ජාතිකඉතිරිකිරීමේබැංකුව | 4,236,135 | 8.23% |
| සේවකඅර්ථසාධකඅරමුදල | 1,863,676 | 3.62% |
| වෙනත් | 2,736,511 | 5.32% |

ඉහත සඳහන් කොටස් තොරතුරු දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රජය විසින් ලබා දී ඇති කොටස් ප්‍රාග්ධනය හා සම්බන්ධ රු. බි. 14.3 ක් වූ අත්තිකාරම් මුදල රහිතවය.

**අවිනිශ්චිත බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්**

2012 මාර්තු මස 31 වන දිනට පැවති අවිනිශ්චිත බැරකම් හා එදින වන විට එළඹි බැඳීම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 24 වන සටහනින් නිරූපණය වේ.

**ශේෂ පත්‍ර දිනයෙන් පසුව උද්ගතවූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 26 වන සටහනින් හෙළිදරව් කර ඇති කරුණු හැරුණු විට ගැළපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන්නා වූ ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවූ කරුණු කිසිවක් උද්ගත වී නොමැත.

**සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති**

ව්‍යාපාර සමූහයේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති වලින් පුද්ගලයා ගරුත්වයෙහිලා සැලකෙන අතර ස්ත්‍රීපුරුෂ භාවය, ජාතිය හෝ ආගම නොසලකා සැමට එක සමාන වෘත්තීය අවස්ථා උදා කර දෙනු ඇත. වසර අවසන සමාගම සහ ඊට අනුබද්ධ ආයතන විසින් සේවයෙහි යොදවන ලද තැනැත්තන් සංඛ්‍යාව 6,367 ක් විය.(2010/11: 5,659)

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

සේවක සේවිකාවනට හා ශ්‍රී ලංකා රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් අද දින දක්වා සිදුකර ඇති බවට තම උපරිම දැනුමේ හා විශ්වාසයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වෙයි.

**පාරිසරික ආරක්ෂාව**

සමූහයට අයත් ව්‍යාපාර කටයුතු මගින් පරිසරයට සෘජු හෝ වක්‍ර බලපෑම් එල්ල විය හැකිය. පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගැනීමත්, බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අදාල අණපනත් වලට අනුකූලව කටයුතු කිරීමත් සමූහයේ ප්‍රතිපත්තියයි.

**ආයතනික පාලනය/අභ්‍යන්තර පාලනය**

වර්තමාන ආයතනික ලෝකය තුල යහපාලන විධි අනුගමනය කිරීම අත්‍යවශ්‍ය නියමයක් බවට පත්ව තිබේ.

සමූහයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පිළිබඳව තමන් වගකීම දරන බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනියි. වත්කම් ආරක්ෂා කිරීම, විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගැනීම හා උත්පාදිත තොරතුරු වල විශ්වාසනීයත්වය යන කාරණා අනෙකුත් කරුණු ද අතර සහතික කෙරෙනු

පිණිස මෙම ක්‍රමවේදය නිර්මාණය කර ඇත. එසේ වුවද, වැරදි සිදුවීම් හා අක්‍රමිකතාවන් කිසියම් සාධාරණ කාලයක් තුළ වළක්වා ගන්නා බවට හෝ අනාවරණය කරගනු ලබන බවට එවැනි ක්‍රමවේදයක් තුළින් වගබලාගත හැක්කේ කිසියම් යුක්ති සහගත මට්ටමක් දක්වා පමණක් වන අතර, එහිලා පූර්ණ සහතිකවීමක් කළ නොහේ. අධ්‍යක්ෂ මණ්ඩලීය විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට අයත් අංගයක් සේ සැකසී ඇත.

මූල්‍ය ප්‍රකාශ අත්සන් කරන ලද දිනය තෙක් කාල පරිච්ඡේදය සඳහා වූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ සඵලත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ.

**ක්‍රියාත්මක ව්‍යාපාර තත්ත්වය**

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි, අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි ලා සමාගම ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

**වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය**

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

| | |
|---|---|
| නිශාන්ත වික්‍රමසිංහ මහතා | - සභාපති |
| නිහාල් ජයමාන්න මහතා, ජ.නී. | - අධ්‍යක්ෂ |
| කපිල චන්ද්‍රසේන මහතා | - අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි |
| ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා | - අධ්‍යක්ෂ |
| මනිලාල් ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| ලක්ෂ්මී සංගක්කාර මහත්මිය | - අධ්‍යක්ෂ |
| සනත් උක්වත්ත මහතා | - අධ්‍යක්ෂ |
| සුසන්ත රත්නායක මහතා | - අධ්‍යක්ෂ |

2011 අප්‍රේල් මස 01 වන දිනට අධ්‍යක්ෂවරයෙකුව සිට ක්‍රිස් නෝනිස් මහතා 2011 සැප්තැම්බර් 29 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ අතර, මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය විසින් පහත සඳහන් අධ්‍යක්ෂවරුන් නම්කර අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබිණි.

| | |
|---|---|
| ලක්ෂ්මී සංගක්කාර මහත්මිය | - 2011 සැප්තැම්බර් 01 |
| සනත් උක්වත්ත මහතා | - 2011 සැප්තැම්බර් 29 |
| ඩබ්ලිව්. ඒ. නාලනී මහත්මිය | - 2011 ඔක්තෝම්බර් 14 |
| සුසන්ත රත්නායක මහතා | - 2011 දෙසැම්බර් 20 |

ඩබ්ලිව්. ඒ. නාලිනී මහත්මිය 2012 ජූලි මස 4 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූවාය.

**ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය**

ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| නිශාන්ත වික්‍රමසිංහ මහතා | - | සභාපති |
| නිහාල් ජයමාන්න මහතා, ජ.නී. | - | අධ්‍යක්ෂ |
| ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා | - | අධ්‍යක්ෂ |
| කපිල චන්ද්‍රසේන මහතා | - | අධ්‍යක්ෂ |
| * සුසන්ත රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| * ආචාර්ය නාලක ගොඩහේවා මහතා | - | අධ්‍යක්ෂ |
| සනත් උක්වත්ත මහතා | - | අධ්‍යක්ෂ |

* ස්වාධීන අධ්‍යක්ෂවරු

2011 අප්‍රේල් මස 01 වන දිනට අධ්‍යක්ෂවරයෙකුව සිටි වෛද්‍ය ක්‍රිස් නෝනිස් මහතා 2011 සැප්තැම්බර් මස 29 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය. 2011 නොවැම්බර් මස 28 වන දින සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සනත් උක්වත්ත මහතා පත් කරන ලදි.

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය**

2012 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන් විසින් කිසිදු පාරිශ්‍රමිකයක් සහ /හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම/පැමිණීම සඳහා වන කිසියම් ගෙවීමකින්ද සමන්විත වෙනත් යම් මුදලක් වන කිසියම් ගෙවීමකින්ද සමන්විත වෙනත් මොනයම් මුදලක් හෝ ලබාගෙන නොමැත. රාජකාරිය පිණිස විදේශගත වන අවස්ථාවන්හිදී අවශ්‍ය හෝටල් නවාතැන් හා ප්‍රවාහන පහසුකම් සඳහා දෛනික දීමනාවක් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හිමිකම් ඇත. ස්වකීය නිල සේවා කාලය තුළ අධ්‍යක්ෂ වරුන්, ඔවුන්ගේ කලත්‍රයන් සහ ඔවුන්ගෙන් යැපෙන දරුවන් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මාර්ගගත ගුවන් සේවාවලට අයත් ව්‍යාපාරික පංතියේ නොමිලේ සංචාරය කිරීමට හිමිකම් ලබා ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය**

තමන් දරන තනතුරේ නිල බලය කරණකොටගෙන සභාපතිවරයා ඇතුලු ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරනු ලබන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් සමාගමට අයත් සාමාන්‍ය කොටස් 03 ක හිමිකරුවෝ වෙති.

**අධ්‍යක්ෂවරුන් දරන ගිවිසුම් සබඳතා**

සමාගමට අයත් යම් කොන්ත්‍රාත්තු වල හෝ යෝජිත කොන්ත්‍රාත්තු වල අධ්‍යක්ෂවරුන් මගින් දරනු ලබන ඍජු හෝ වක්‍ර සම්බන්ධතා කිසිවක් නොමැත.

**වාර්ෂික මහ සභා රැස්වීම**

2012 සැප්තැම්බර් මස 24 වන දින වාර්ෂික මහසභා රැස්වීම පවත්වනු ලැබේ.

**විගණකවරු**

වරලත් විගණකවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ විගණකවරුන් වශයෙන් නැවත පත් කරනු ලැබීමේ යෝජනාවක් 2007 අංක 07 දරන සමාගම් පනත අනුව වාර්ෂික මහසභා රැස්වීමට ඉදිරිපත් කෙරෙනු ඇත.

විගණකවරුන්ගේ ගාස්තු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 20 වන සටහනෙහි දක්වා ඇත. සමාගම සමග හෝ එහි අනුබද්ධ ආයතනය සමඟ (විගණකවරයෙකු වශයෙන් පවත්නා සම්බන්ධය හැරුණු විට) කිසිදු විගණකවරයෙකුගේ සබඳතාවක් නොමැත.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,**

**අ/කළේ - මිල්ඩ්‍රඩ් පීරිස්**
**සමාගමේ ලේකම්**

**............................**

**...........................**

**අ/කළේ - අධ්‍යක්ෂ** **අ/කළේ - අධ්‍යක්ෂ**

**2012.08.17**

## අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් විගණකවරුන්ගේ වාර්තාවේ 31 වන පිටුවෙහි ගෙනහැර දක්වා ඇති විගණකවරුන්ගේ වගකීම් වලට වඩා වෙනස් වේ.

මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමේ සහ සමූහයේ කටයුතු වල තත්ත්වය පිළිබඳ හා අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ලාභය හෝ අලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු වන පරිදි එක් එක් මූල්‍ය වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂක වරුන් විසින් පිළියෙල කරනු ලැබිය යුතු බවට 2007 අංක 07 දරන සමාගම් පනත මගින් නියම කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි ලා ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ඒවා සුසංගත අයුරින් යොදා ඇත. යුක්තයුක්ත වූද, විචක්ෂණශීලී වූද නිගමන හා ඇස්තමේන්තු එහිලා සිදුකර ඇත. අදාළ පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ද අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවටත්, 2007 අංක 07 දරන සමාගම් පණතින් නියම කර ඇති පරිදි අදාල තොරතුරු සැපයෙන බවටත් සහතික වනු පිණිස සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය යුක්ති සහගත නිවැරදිතාවයකින් යුක්තව හෙළිදරව් කිරීම සඳහා අදාළ සමාගම් සහ අනුබද්ධ ආයතන ප්‍රමාණවත් ගිණුම් වාර්තා තබා ගත යුතු බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. සමූහයට අයත් වත්කම් ආරක්ෂා කරගනු පිණිස යුක්ති සහගත ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඔවුහු දරති. ඒ අනුව සලකන කළ වංචා හා අක්‍රමිකතා සිදුවීම වැළැක්වීමේ අටියෙන් සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සම්බන්ධයෙන්ද නිසි සැලකිල්ලක් ඔවුන් විසින් දැක්විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහි ලා ක්‍රියාකාරී ව්‍යාපාර පදනම අනුගමනය කිරීම අධ්‍යක්ෂකවරුන් තව දුරටත් පවත්වාගෙන ගියේය. සමාගමට අයත් මූල්‍ය ප්‍රවාහය හා ණය ගැනුම් පහසුකම් ඇතුළු 2012 මාර්තු 31 වන දිනට අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන අයවැය ලේඛනය පිළිබඳව විමසා බලා ඒ පිළිබඳව සමාලෝචනයක්ද කිරීමෙන් පසුව ස්වකීය මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගම සන්තකයේ ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් ඇතැයි අධ්‍යක්ෂවරු සලකති.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ස්වකීය මතය ගොඩනගා ගැනීමට තමන්ට හැකිවනු පිණිස සුදුසු වේයැයි ඔවුන් සලකනු ලබන මොනයම් හෝ පරීක්ෂා කිරීමක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා දෙනු ලබන බවට සහතික වනු සඳහා අධ්‍යක්ෂවරුන් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ශේෂ පත්‍රයේ දිනට සමාගමට සහ එහි අනුබද්ධ ආයතනයට අදාළව පැවති සියලු බදු හා ගාස්තු මෙන්ම අනෙකුත් මූල්‍ය බැඳීම්ද ගෙවා ඇති බවත්, එසේ නැතහොත් ඒවා අදාළ මූල්‍ය ප්‍රකාශ මගින් ප්‍රතිපාදනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව තහවුරු කර සිටී.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,**

**අ/කළේ - මිල්ඩ්‍රඩ් පීරිස්**
**සමාගමේ ලේකම්**

**2012අගෝස්තු 17 දින**

## මණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව

**සාමාජිකයෝ**

2011 අප්‍රේල් මස 01 වන දිනට ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගමේ විගණන කමිටුව ජනාධිපති නීතිඥ, නිහාල් ජයමාන්න (සභාපති) හා වෛද්‍ය ක්‍රිස් නෝනිස් යන මහත්වරුන්ගෙන් හා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කළ වරලත් ගණකාධිකාරී, ලලිත් විතාන මහතාගෙන් සමන්විත විය.

2011 අගෝස්තු මස 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිතයෙකු වන එස්. එම්. චන්ද්‍රපාල මහතා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කළේය.

සභාපති ධූරය දැරූ ජනාධිපති නීතිඥ, නිහාල් ජයමාන්න මහතා වෛද්‍ය නිවාඩු මත පසුවීමත්, 2011 සැප්තැම්බර් මස 29 වන දින වෛද්‍ය ක්‍රිස් නෝනිස් මහතා සිය තනතුරෙන් ඉල්ලා අස්වීමත්, යන හේතු මත, අධ්‍යක්ෂ මණ්ඩලය, 2012 පෙබරවාරි මස 29 වන දින පැවති ස්වකීය රැස්වීමේදී මණ්ඩලීය විගණන කමිටුව නැවත ස්ථාපිත කිරීම අනුමත කරන ලද අතර විධායක නොවන අධ්‍යක්ෂක වරුන් වන සුසන්ත රත්නායක, ලක්ෂ්මී සංගක්කාර සහ සනත් උක්වත්ත යන මහත්ම මහත්මීන් සාමාජිකයින් ලෙස පත් කරන ලදි. මණ්ඩලීය විගණන කමිටුවේ තාවකාලික සභාපතිවරයා ලෙස සුසන්ත රත්නායක මහතා පත් කෙරිණි.

**කාර්යභාරය හා වගකීම්**

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, පොදු පාලනය, විගණන ක්‍රියාවලිය සහ අණ පනත් හා රෙගුලාසි/ආචාර ධර්ම පද්ධති වලට අනුකූලතාව දැක්වීමේ සමාගමේ ක්‍රියාවලිය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ස්වකීය ප්‍රමාද දෝෂයන් හා සම්බන්ධ වගකීම් ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම මණ්ඩලීය විගණන කමිටුවේ මූලික කාර්ය භාරයයි.

මණ්ඩලීය විගණන කමිටුවේ වගකීම් වලට පහත සඳහන් කටයුතු ඇතුලත් වේ.

- තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලන කටයුතු ඇතුලත් අභ්‍යන්තර කාර්යයන් පිළිබඳ කර්තව්‍යයන් හා ක්‍රියාවලි සමාලෝචනය කිරීම.
- කළමනාකරණය වෙත හා නියාමන බලධාරීන් මෙන්ම කොටස් හිමියන් වෙත නිවැරදිව, ප්‍රශස්ත ලෙස හා කලට වේලාවට තොරතුරු සැපයීමේ අරමුණ පෙරදැරිව මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සමාලෝචනය කිරීම.
- ව්‍යාපාර අවදානම් ආශ්‍රිත කළමනාකරණය සමාලෝචනය කිරීම හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- ප්‍රධාන ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා, සමාගමේ ප්‍රතිපත්ති හා කර්මාන්ත ක්ෂේත්‍රයේ විශිෂ්ටතම පරිචයන් සමඟ සමාගමේ අනුකූලතාව දැක්වීම සමාලෝචනය කර අධීක්ෂණය කිරීම.

- අභ්‍යන්තර විගණන කර්තව්‍ය කළමනාකරණය සමාලෝචනය කිරීම.
- බාහිර විගණනයේ ස්වාධීනත්වය සමාලෝචනය කිරීම.

**රැස්වීම්**

2012 මාර්තු 31 වන දිනයෙන් අවසන් වූ වර්ෂය තුල මණ්ඩලීය විගණන කමිටුව රැස්වීම් 02 ක් පවත්වන ලදි. නිශ්චිත කරුණු පිළිබඳව මණ්ඩලීය විගණන කමිටුව දැනුවත් කිරීම සඳහා සමාගමේ කළමනාකරණ සාමාජිකයන් ඔවුනට ලැබුණු ආරාධනය පරිදි ඉහත රැස්වීම් වලට සහභාගි විය.

**සමූහාරක්ෂණ හා උපදේශක සේවා**

විගණන කමිටුවට සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශයේ (කලින් සමූහයේ අභ්‍යන්තර විගණන අංශය ලෙස හඳුන්වන ලද) ඇඩි සහය ලැබේ. සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශයේ ජොෂ්ඨ කළමනාකරු විගණන කමිටුවට ඍජුවම වාර්තා කරයි. සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශය විසින් සටහන් කරනු ලබන ප්‍රධාන උපාය මාර්ගික හා පාලන ගැටළු සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශයේ ජොෂ්ඨ කළමනාකරු මණ්ඩලීය විගණන කමිටුව වෙත වාර්තා කරයි.

සමූහාරක්ෂණ හා උපදේශන සේවා අංශය විසින් ඉටු කරනු ලබන විගණන කටයුතු වල ප්‍රගතිය මණ්ඩලීය විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇති අතර, අභ්‍යන්තර පාලන පද්ධතිය සවිමත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අදාළ නිර්දේශ සිදු කරනු ලැබ ඇත.

**බාහිර විගණනය**

විගණකවරුන්ගේ වාර්තාව හා ඔවුන් විසින් නිකුත් කරන ලද කළමනාකරණ ලිපිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා බාහිර විගණකවරුන් සමාලෝචිත වසර තුළ මණ්ඩලීය විගණන කමිටුව මුණ ගැසුණේය.

**අ/කළේ - සුසන්ත රත්නායක**

**සභාපති - මණ්ඩලීය විගණන කමිටුව**

**2012.08.16**

අර්න්ස්ට් ඇන්ඩ් යංග්
වරලත් ගණකාධිකාරීවරු
201, ද සේරම් පෙදෙස,
තැ.පෙ.101,
කොළඹ 10.

## ශ්‍රී ලංකන් එයාලයින් සමාගමේ කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

### මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

2012 මාර්තු මස 31 වන දිනට පිළියෙල කල ශේෂ පත්‍ර වලින්ද, එදිනට අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශ, කොටස් ආයෝජනයේ වෙනස්වීම් ප්‍රකාශ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින්ද, වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සම්පිණ්ඩනයකින් හා කරුණු පැහැදිලි කිරීමේ වෙනත් සටහන් වලින්ද සමන්විත සී/ස ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගමට (“සමාගම”) අයත් මීට යා කර ඇති මූල්‍ය ප්‍රකාශ සහ එකී සමාගමට සහ එහි අනුබද්ධ සමාගමට අයත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරනු ලැබ තිබේ.

### මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණය උසුලයි. වංචා හා වැරදි හේතුකාරකව තිබුණද නොතිබුණද සැලකිය යුතු අවප්‍රකාශ වලින් තොරව අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන්නා වූ අභ්‍යන්තර පාලනය, පිරිසැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම යන කරුණුද, ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා යොදා ගැනීම යන කරුණුද, අවස්ථානුරූපව යුක්තිසහගත වන්නාවූ ගිණුම් ඇස්තමේන්තු සාධනය යන කරුණු ද මෙහි වගකීමෙහි ලා අන්තර්ගත වේ.

### විගණනයේ විෂය පථය හා මතයේ පදනම

අපගේ වගකීම වන්නේ අප විගණනය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීමය. අප අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුව ඉටු කර ඇත. අදාළ මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අවප්‍රකාශ වලින් තොරව පවතින්නේද නොපවතින්නේද යන කරුණු පිළිබඳව යුක්ති සහගත සහතිකයක් ලබා ගැනීම සඳහා අදාළ විගණනය අප විසින් සැලසුම් කර ඉටුකරනු ලැබ තිබීම එකී ප්‍රමිතීන් තුළින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශ වල අගයන් සහ හෙළිදරවු කිරීම් වලට උපකාරී වන සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගණනයකට ඇතුළත් වේ. කළමනාකරණය විසින් භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා සකසන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයකට ඇතුළත් වේ.

අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණන කාර්යය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගතිමු. එසේ හෙයින් අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් සපයන්නේ යැයි අප විශ්වාස කරමු.

**මතය**

අපගේ මතයට අනුව, අපගේ පරීක්ෂණයෙන් මේ දක්වා පෙනී යන අන්දමට, 2012 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන ගොස් ඇති බවත්, 2012 මාර්තු මස 31 වන දිනට සමාගමේ කටයුතු වල තත්වය පිළිබඳව හා එදිනට අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ අලාභය හා එහි මුදල් ප්‍රවාහය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කරන බවත් පෙන්නුම් කරයි.

අපගේ මතයට අනුව, 2012 මාර්තු මස 31 වන දිනට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ අලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව ඉදිරිපත්කර ඇතැයි යනුවෙන්ද, සමාගමේ සහ එහි අනුබද්ධ සමාගමේ කටයුතු ඊට අයත් කොටස් හිමියන්ගේ අවශ්‍යතාවන්ටද සැලකිල්ල යොමු කරමින් එදින වනවිට ඉටුකර ඇතැයි යනුවෙන්ද සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන හැර දක්වයි.

අපගේ මතය හා කිසිදු බැඳීමකින් තොරව මෙම මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති 2.1.2 වන සටහනට අපි අවධානය යොමු කරන්නෙමු.

**වෙනත් නෛතික හා නියාමන කරුණු පිළිබඳ වාර්තාව**

අපගේ මතයට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151(2) සහ 153(2) සිට 153(7) දක්වා වූ වගන්ති වල නියමයන් සමඟ අනුකූල වේ.

**අ/කළේ - අර්න්ස්ට් ඇන්ඩ් යංග්**
**වරලත් ගණකාධිකාරිවරු**
**කොළඹ.**
**2012.08.17**

# ශ්‍රී ලංකන් එයාලයින්ස් ලිමිටඩ්

**2012 මාර්තු 31 දිනට**

**ශේෂ පත්‍රය**

| | සටහන | සමූහය 2012 | සමූහය 2011 | සමාගම 2012 | සමාගම 2011 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රු.මී. | රු.මී. | රු.මී. | රු.මී. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | 3 | 7,238.43 | 4,647.69 | 5,316.64 | 2,558.82 |
| ගුවන් යානා එන්ජින් වල ප්‍රධාන අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් | 4 | 6,684.88 | 6,080.36 | 6,684.88 | 6,080.36 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 5 | 15,372.86 | 8,849.84 | 15,372.86 | 8,849.84 |
| ගුවන් යානා හා අතිරේක එන්ජින් තැන්පතු | | 3,131.57 | 2,156.38 | 3,131.57 | 2,156.38 |
| අස්පෘශ්‍ය වත්කම් | 6 | 56.11 | 111.69 | 55.77 | 110.07 |
| ආයෝජන | 7 | 14,232.17 | 65.36 | 14,274 .21 | 107.40 |
| | | 46,716.02 | 21,911.32 | 44,835.93 | 19,862.87 |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | 8 | 4,513.76 | 4,490.19 | 4,232.38 | 4,259.99 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත | 9 | 13,897.30 | 10,553.71 | 13,160.92 | 10,055.27 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 5 | 2,608.50 | 2,506.16 | 2,608.50 | 2,506.16 |
| බැංකු හා මුදල් ශේෂය | 10 | 2,027.65 | 1,757.24 | 1,733.32 | 1,455.17 |
| | | 23,047.21 | 19,307.30 | 21,735.12 | 18,276.59 |
| **මුළු වත්කම්** | | 69,763.23 | 41,218.62 | 66,571.05 | 38,139.46 |
| **කොටස් ආයෝජන හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 11 | 19,432.67 | 5,146.35 | 19,432.67 | 5,146.35 |
| සංචිත | 12 | 2,576.72 | 1,846.05 | 1,905.01 | 1,168.34 |
| සමුච්චිත අලාභය | | (17,855.84) | (683.85) | (22,776.58) | (3,097.87) |
| **මුළු කොටස් ආයෝජනය** | | 4,153.55 | 6,302.55 | (1,438.90) | 3,216.82 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| වරණීය කොටස් | 13 | 1000 | 1000 | - | - |
| ලාභ දරන බැරකම් | 14 | 3,752.26 | 1,824.63 | 4,788.03 | 2,914.21 |
| ජංගම බැරකම් | 15 | 5,232.48 | 4,211.97 | 4,962.06 | 3,990.46 |
| වෙනත් විලම්භිත බැරකම් | | 9,984.74 | 7,036.60 | 9,750.09 | 6,904.67 |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත | 16 | 46,211.85 | 21,006.09 | 48,667.33 | 21,482.97 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 211.03 | 204.98 | 175.45 | 175.45 |
| ලාභ දරන බැරකම් | 14 | 9,202.06 | 6,668.40 | 9,417.08 | 6,359.55 |
| | | 55,624.94 | 27,879.47 | 58,259.86 | 28,017.97 |
| **මුළු කොටස් ආයෝජනය හා බැරකම්** | | 69,763.23 | 41,218.62 | 66,571.05 | 38,139.46 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූල වේ.

......................................
**අ/කළේ : මූල්‍ය අංශ ප්‍රධානී**

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම උසුලයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබමි.

................................... ...............................
**අ/කළේ : අධ්‍යක්ෂ** **අ/කළේ : අධ්‍යක්ෂ**

අංක 37 සිට 74 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයන් නියෝජනය කරයි.
2012.08.17 වන දින කොළඹදීය.

**2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශය**

| | සටහන | සමූහය 2012 රු.මි. | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|---|
| ආදායම | 17 | 92,257.04 | 78,515.24 | 90,544.22 | 77,125.45 |
| විකුණුම් පිරිවැය | | (97,946.07) | (71,995.59) | (99,395.48) | (73,187.54) |
| දළ (අලාභය)/ලාභය | | (5,689.03) | 6,519.65 | (8,851 .26) | 3,937.91 |
| වෙනත්ආදායම්හාලාභ | 18 | 1,196.66 | 3,661.84 | 421.70 | 4,489.25 |
| විකුණුම් සහ අලෙවි පිරිවැය | | (7,479.93) | (6,329.48) | (7,479.93) | (6,329.48) |
| පරිපාලන වියදම් | | (3,751 .00) | (3,244.48) | (2,501 .41) | (1,817.32) |
| මූල්‍ය වියදම් | 19.1 | (1,642.30) | (831.89) | (1,462.20) | (671.48) |
| මූල්‍ය ආදායම | 19.2 | 204.56 | 47.62 | 197.68 | 13.37 |
| **බදු පූර්ව අලාභය** | 20 | (17,161 .04) | (176.74) | (19,675.42) | (377.75) |
| ආදායම් බදු වියදම් | 21 | (10.95) | (25.58) | (3.29) | (3.86) |
| **වර්ෂය සඳහා අලාභය** | | (17,171.99) | (202.32) | (19,678.71) | (381.61) |
| එක් කොටසක් අනුව මූලික ඉපයීම් (රු.) | 22 | (333.67) | (3.93) | (382.38) | (7.42) |

පිටු අංක 37 සිට 74 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යාම අංගයක් නියෝජනය කරයි.

2012.08.17 දින,

කොළඹදීය.

**කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

**2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| සමූහය | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ආදායම් සංචිතය | පොදුසංචිතය | සමුච්චිත ලාභය (අලාභය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **2010 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,114.27 | 0.63 | 53.44 | 518.47 | 6,833.16 |
| දේපළ,පිරියතහාඋපකරණවලප්‍රත්‍යාගණන අතිරික්තය | 12.1 | - | 671.71 | - | - | - | 671.71 |
| වරණීය කොටස් නිකුතුව - 10 වසර පරිවර්ත්‍ය | 13 | - | - | - | - | (1,000.00) | (1,000.00) |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | (202.32) | (202.32) |
| **2011 මාර්තු මස 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,785.98 | 0.63 | 53.44 | (683.85) | 6,302.55 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | 14,286.32 |
| දේපළ,පිරියතහාඋපකරණප්‍රත්‍යාගණන අතිරික්තය | 12.1 | - | 736.67 | - | - | - | 736.67 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | (17,171.99) | (17,171.99) |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 2,522.65 | 0.63 | 53.44 | (17,855.84) | 4,153.55 |

| සමූහය | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ආදායම් සංචිතය | පොදුසංචිතය | සමුච්චිත ලාභය (අලාභය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **2010 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,114.27 | 0.63 | 53.44 | (2,716.26) | 3,598.43 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | (381.61) | (381.61) |
| **2011 මාර්තු මස 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,114.27 | 0.63 | 53.44 | (3,097.87) | 3,216.82 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | 14,286.32 |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය | 12.1 | - | 736.67 | - | - | - | 736.67 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | (19,678.71) | (19,678.71) |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 1,850.94 | 0.63 | 53.44 | (22,776.58) | (1,438.90) |

අංක 37 සිට 74 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

2012.08.17 දින,

කොළඹදීය.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2012 මාර්තු 31 දිනට අවසන් වර්ෂය

| | සටහන | සමූහය 2012 | සමූහය 2011 | සමාගම 2012 | සමාගම 2011 |
|---|---|---|---|---|---|
| | | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **මෙහෙයුම් කටයුතු වලින්/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදම් පූර්ව අලාභය | | (17,161.04) | (176.74) | (19,675.42) | (377.75) |
| ගැළපුම් කිරීම: | | | | | |
| ක්ෂයවීම /කාලික ණය හිලව් කිරීම | | 3,689.90 | 4,312.88 | 3,434.06 | 3,968.63 |
| මූල්‍ය පිරිවැය | 19.1 | 1,642.30 | 831.89 | 1,462.20 | 671.48 |
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණ (ලාභය) / අලාභය | 18 | 8.87 | (2,181.15) | 8.87 | (2,178.19) |
| මූල්‍ය ආදායම | 19.2 | (204.56) | (47.62) | (197.68) | (13.37) |
| වරණීය කොටස් විකුණුම් ලාභය | 18 | - | (1,000.00) | - | (1,000.00) |
| ලාභාංශ ආදායම | 18 | - | - | (150.00) | (695.34) |
| බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදන ප්‍රතිවර්තනය | | - | (18.81) | - | - |
| මන්දගාමීව චලනය වන ඉන්වෙන්ට්‍රි බඩු ප්‍රතිපාදනය | 20 | 101 .40 | 98.21 | 101.40 | 98.21 |
| නඩත්තු සංචිත අඩමාණ අයකරගැනීම් ප්‍රතිපාදනය-පොළී හැර | | 148.69 | 402.24 | 148.69 | 402.24 |
| උපලබ්ධි නොවූ විනිමය (ලාභයේ) / අලාභයේ බලපෑම | | (1,065.21) | 417.29 | 49.02 | 405.72 |
| ප්‍රවාහන පූර්ව විකුණුම් ලියාදැන්වීම | | (3,775.09) | (4,326.37) | (3,775.09) | (4,326.37) |
| පාරිතෝෂික ප්‍රතිලාභ | 15.1 | 639.35 | 407.21 | 570.29 | 351.81 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් පූර්ව මෙහෙයුම් අලාභය | | (15,975.39) | (1,280.97) | (18,023.66) | (2,692.93) |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වැඩිවීම | | (124.97) | (667.08) | (73.79) | (649.17) |
| වෙළඳ හා වෙනත්ලැබීම් නියමිත වැඩිවීම | | (2,821.62) | (2,300.64) | (2,595.67) | (2,294.11) |
| වෙළඳහාවෙනත්ගෙවීම් නියමිතවැඩිවීම | | 27,632.24 | 6,160.86 | 28,830.23 | 6,807.32 |
| නඩත්තු සංචිත වැඩිවීම | | (4,326.70) | (4,098.75) | (4,326.70) | (4,098.75) |
| ගුවන්යානා ආරක්ෂක තැන්පතු වැඩිවීම | | (552.97) | (807.89) | (552.97) | (807.89) |
| මෙහෙයුම්කටයුතුවලින්ජනනයවූ/ (යොදාගත්) මුදල් | | 3,830.59 | (2,994.47) | 3,257.44 | (3,735.53) |
| ගෙවූ මූල්‍යයන පිරිවැය | | (1,087.41) | (746.70) | (917.67) | (661.19) |
| ගෙවූ පාරිතෝෂික | 15.1 | (112.22) | (117.75) | (92.08) | (104.02) |
| ගෙවූ ආදායම් බදු | | (13.60) | (11.65) | - | - |
| මෙහෙයුම්කටයුතුවලින්/(යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රවාහ | | 2,617.36 | (3,870.57) | 2,247.69 | (4,500.74) |
| **මෙහෙයුම්කටයුතුවලින්/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලැබූ පොළිය | | 20.30 | 44.70 | 13.42 | 10.45 |
| කොටස් ආයෝජන | | (0.87) | (41.44) | (0.87) | (41.44) |
| වරණීය කොටස් විකුණුමෙන් ලැබූ මුදල් | | | - 1,000.00 | - | 1,000.00 |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | | (1,503.93) | (968.39) | (1,428.75) | (894.13) |
| එන්ජින් අලුත්වැඩියා සඳහා ගෙවීම් | | (3,199.40) | (2,171.42) | (3,199.40) | (2,171.42) |
| අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම් | | (1.55) | (6.95) | (1.40) | (5.51) |
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණයෙන් ලත් මුදල් | | 12.60 | 14,529.97 | 12.60 | 14,526.56 |
| ආයෝජන කටයුතු වලින් / (යොදාගත්) ශුද්ධ මුදල් | | (4,672.85) | 12,386.47 | (4,604.40) | 12,424.51 |
| **මූල්‍යනකටයුතුවලින්/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| පොලී දරන බැරකම් ආපසු ගෙවීම | 14 | (2,548.83) | (14,947.09) | (2,239.87) | (14,438.80) |
| පොලී දරන ණය සහ ණයගැනුම් වලින් ලත් මුදල් | | 5,119.05 | 3,029.21 | 5,119.05 | 3,017.65 |
| මූල්‍යනකටයුතුවලින්/(යොදාගත්) ශුද්ධ මුදල් | | 2,570.22 | (11,917.88) | 2,879.18 | (11,421.15) |
| **මුදල් හා මුදල් සාමාන්‍යයන්හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | 514.73 | (3,401.98) | 522.47 | (3,497.38) |
| **වසරාරම්භ මුදල් හා මුදල් සාමාන්‍යයන්** | 10 | (3,853.12) | (451.15) | (4,155.19) | (657.81) |
| **වසරාවසාන මුදල් හා මුදල් සාමාන්‍යයන්** | 10 | (3,338.39) | (3,853.12) | (3,632.72) | (4,155.19) |

අංක 37 සිට 74දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නිරූපණය කරයි.

2012.08.17 වන දින කොළඹදීය.

# 1. ආයතනික තොරතුරු

## 1.1සාමාන්‍ය

**සමාගම**

ශ්‍රී ලංකන් එයාලයින්ස් ලිමිටඩ් ("සමාගම") ආයතනය ශ්‍රී ලංකාව තුළ සංස්ථාගතව හා නිවෙස්නගතව ඇති සීමිත වගකීම් සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ගුවන් සමාගම් මධ්‍යස්ථානය (එයාලයින් සෙන්ට), බණ්ඩාරනායක ගුවන් තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

## 1.2ප්‍රධාන කර්තව්‍යන් හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

**සමාගම**

මගීන්, ගුවන් බඩු හා ගුවන් තැපැල ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර වශයෙන් නිශ්චිත කාලසටහන් සහිතව සහ රහිතව ශ්‍රී ලංකාව තුළ නම් කළ ගුවන් බඩු ප්‍රවාහකයා වශයෙන් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සමාගමේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේද ගුවන් ගමන් පර්යන්ත සේවා සැපයීමත්, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීමත්, අභ්‍යන්තර හා බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීමත්, මගී ප්‍රවාහනය සඳහා දේශීය ගුවන් ටැක්සි සේවා ක්‍රියාත්මක කිරීමත් සමාගමේ අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. සමාගමේ සහායක සේවා කටයුතු සමන්විත වනුයේ තෘතීය පාර්ශව වලට නඩත්තු සේවා සැපයීමත්, ගුවන් යානා මෙහෙයුම් සේවා සලසා දීමත්, ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීමත් යනාදියෙනි.

**අනුබද්ධ සමාගම - ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ්**

ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් ("අනුබද්ධ සමාගම") ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් වලට ගුවන්යානාස්ථ ආහාර පාන සැපයුම් සේවා සලසාදීමය. සමාගමේ සහායක සේවා, පොදු හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හල් ක්‍රියාත්මක කිරීම, ලොන්ඩරි සේවා සැපයීම හා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගුවන් ගමන් මගී මාර්ගස්ථ හෝටලය කළමනාකරණය යනාදී කටයුතු වලින් සමන්විතවේ.

## 1.3නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2012 අගෝස්තු මස 17 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව 2012 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් බලය පවරා දෙන ලදි.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1පිළියෙළ කිරීමේ පදනම

වෙනත් අයුරකින් සඳහන් කර නොමැති නම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලැබ ඇත්තේ උපචිත පදනමක් මත ඓතිහාසික පිරිවැය සම්මුතියක් යටතේය. මෙම මූල්‍යප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින් ඉදිරිපත් කරනු ලබන අතර වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට, සියලුම මුදල් අගයන් ආසන්නතම රුපියල් සියදහසට වටරවුම් කර ඇත.

### 2.1.1අනුකූලතා ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් (“මූල්‍ය ප්‍රකාශ”) සමග ඉදිරිපත් කර ඇති ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, කොටස් ආයෝජන වල වෙනස්කම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් හා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව පිළියෙළ කර ඇත.

### 2.1.2ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

ප්‍රවර්තන වර්ෂය තුල සමාගම රු. මි. 19,678.71 ක අලාභයක් (2011: රු.මි. 381.61 ) අත් වින්දේය. තවද සමාගම රු.මි.22,776.58 ක සමුච්චිත අලාභයක් (2011: රු.මි.3,097.87 ) වාර්තා කළ අතර සමාගමේ ජංගම බැරකම් රු.මි. 36,524.74 කින් (2011: රු.මි. 9,741.38 ) සමාගමේ ජංගම වත්කම් ඉක්මවා ගොස් ශේෂ පත්‍රයේ දිනට සමාගමේ මුළු කොටස් ආයෝජන ප්‍රමාණය රු.මි. 1438.90 ක් වූ සෘණ ශුද්ධ අගයක් දක්වා පහත වැටී ඇත.

ගුවන් සමාගම විසින් අත්විඳි අලාභයට සාධක කිහිපයක් හේතුවූ අතර, එහිලා ප්‍රධාන වශයෙන් බලපෑ බාහිර සාධකය වූයේ ගෝලීය ගුවන් ප්‍රවාහන කර්මාන්තය තුළ මෑත අතීතයේදී විද්‍යාමාන වූ සමස්ථ කාර්ය සාධනය ආශ්‍රිත පිරිහීමය. එබඳු පිරිහීමකට ප්‍රමුඛ හේතුසාධක ලෙස ඉන්ධන මිල සැලකිය යුතු ලෙස ඉහළ යාමත්, යුරෝපීය අවපාතයත්, මැදපෙරදිග කලාපයේ දේශපාලනමය අර්බුදසහගත බවත් ගෙනහැර දැක්විය හැකිය. තවද,අභ්‍යන්තරික වශයෙන් එල්ලවූ ප්‍රධාන බාධාව වූයේ මෙහෙයුම් කටයුතු වල කාර්යක්ෂමතාව අත්කර ගනිමින් තරඟකාරී මට්ටමින් කටයුතු කිරීම සඳහා ගුවන් යානා ඇණිය පුළුල් කර නවීකරණය කිරීම පිණිස ප්‍රමාණවත් අරමුදල් නොමැති වීමය.

රටේ අනාගත අභිවෘද්ධිය සඳහා වූ ශ්‍රී ලංකා රජයේ දැක්ම තුළින් එහි සංචාරක කර්මාන්තය සංවර්ධනයත්,ශ්‍රී ලංකාව කලාපය තුළ ගුවන් සේවා කේන්ද්‍රස්ථානය ලෙස බිහි කිරීමත් යන කරුණු සනිටුහන් වේ. ජාතික ප්‍රවාහකයා ලෙස ශ්‍රී ලංකන් ගුවන් සමාගම ජාතික ප්‍රතිපත්තියේ හා උපාය මාර්ගික හා ආර්ථික ප්‍රයත්නයන්හි වැදගත් හවුල්කරුවෙකු සේ සැලකේ. ඒ අනුව ශ්‍රී ලංකා රජය ස්වකීය ජාතික අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමේ කාර්යයෙහි ලා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් පමණක් නොව එහි ව්‍යාප්තිය හා තිරසාර බව පිළිබඳවද සැදී පැහැදී කටයුතු කරයි.

පසුගිය වසර තුළ සමාගම විසින් ක්‍රියාවට නංවන ලද පස් අවුරුදු ව්‍යාපාරික සැලැස්ම (ජාත්‍යන්තර ගුවන් සේවා උපදේශක වරුන් විසින් තහවුරු කරන ලද) ක්‍රමික වර්ධනයක් සහිතව දියත් කර හරිනු ලැබ තිබේ. ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් මෙම ව්‍යාපාරික සැලැස්ම ගුවන්යානා ඇණිය පුළුල් කිරීම/නවීකරණය කිරීම ආශ්‍රිත වැඩසටහන් හඳුනාගෙන ඇති අතර ඒ අනුව සමාගමට අයත් වන ගුවන් යානා ඇණිය වැඩිවර්ධනය කිරීමේ කාර්යය සැලසුමට අනුගතවම සිදු වේ.

පසුගිය මූල්‍ය වර්ෂය තුළදී අමාත්‍ය මණ්ඩලය විසින් ඇ.ඩො. මිලියන 500 ක වටිනාකමකින් යුක්තව අනුමත කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණයක් සලසා දීමද ඇතුළත් මෙම ව්‍යාපාරික සැලැස්මට අනුබල දීම පිණිස ශ්‍රී ලංකා රජය කටයුතු කීපයකට දැන් මුලපුරා තිබේ. මෙම පස් අවුරුදු සැලැස්මේ කොටසක් වශයෙන්, ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ රු.මි. 14,286.32 ක් ලෙස ගණනය වන මූලික මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් ආයෝජනය කරන ලදි. එහිලා තවදුරටත් ලබාදුන් මූලාරම්භයක් වූයේ, අරමුදල් සලසාගනු පිණිස සමාගමේ සමස්ථ ශේෂපත්‍රය සවිමත් කරන්නා වූ ඇපකර සපයා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමය. ඒ අනුව. 2012 මැයි මාසයේදී ඇමෙරිකන් ඩොලර් මිලියන 175 ක් වටිනා මූල්‍ය පහසුකම් සපයා ගැනීමට සමාගමට හැකිවිය.

තවද, ආදායම ඉහළ නංවා ගැනීම, ගුවන් යානා ඇණිය පුළුල් කිරීම, ගුවන් ගමන් මාර්ග ජාලය හා ගමන් වාර ගණන උපරිම කිරීම සඳහාත්, ඵලදායී පිරිවැය පාලනයක් සහතික කෙරෙනු සඳහාත් සමාගම විසින් පසුගිය කාල වකවානුව තුළ ගන්නා ලද ක්‍රියාමාර්ග, මෙහෙයුම් කාර්යක්ෂමතා කටයුතු වැඩිදියුණු කිරීමෙහි ලා සමාගම විසින් දැනටමත් පවත්වාගෙන යනු ලබන ප්‍රයත්නයන් තුළ තවදුරටත් නොකඩවා පවත්වාගෙන යන ලදි.

අනෙකුත් වැදගත් සිදුවීම්හිලා, ජගත් කීර්තියට පත් "ඒකීය ලොවක්" නැමැති ගුවන් සමාගම් සන්ධානයේ පත්කළ සාමාජිකයෙකු බවට සමාගමේ ඇතුළත්වීම ගිණිය හැකිය. මෙමගින්, සමාගමේ වර්ධන උපායමාර්ගය කෙරෙහි අනුබල සැලසෙන අයුරින් හා ගුවන් සමාගම් ආශ්‍රිත ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් විශාලතම හා විශිෂ්ටතම වෙළඳ සන්නාම සමඟ උරෙනුර ගැටී පියාසර කරමින් ලොවපුරා පිහිටි නව ගමනාන්ත 800 කට වැඩි ප්‍රමාණයක් හා සබඳතා ගොඩ නැගෙන පරිදි සිය ගෝලීය නියෝජනය සනිටුහන් කර ගැනීමට සමාගමට හැකි වනු ඇත.

යථෝක්ත ආයෝජන සැපයුම සහ අරමුදල් සලසා දීමේ හා මෙහෙයුම් කටයුතු ඉටු කිරීමේ අනෙකුත් මූලාරම්භ අන්තර්ගත වන්නා වූ සමාගම විසින් ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද පස් අවුරුදු ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව ලාභදායකත්වය නංවා ගැනීමටත්, සමාගමේ වත්කම් සවිබල ගැන්වීමටත්, නුදුරු අනාගතයේදී සමාගම සඵල ව්‍යාපාරයක් ලෙස නොකඩවා පවත්වාගෙන යාමට හැකිවෙතැයි යන්න අධ්‍යක්ෂක මණ්ඩලයේ තක්සේරුව වන අතර ඒ පිළිබඳව දැඩි විශ්වාසයද ඔවුහු පළ කරති.

### 2.1.3සංසන්දනාත්මක තොරතුරු

අනුගමනය කරනු ලැබ ඇති ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු, මෙහි 23 වන සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි දැක්වෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස හැරුණු විට, ඉකුත් මූල්‍ය වර්ෂයේ ප්‍රතිපත්ති වලට හා ඇස්තමේන්තු වලට අනුකූල වේ. ඉකුත් වසරට අදාළ සංඛ්‍යා හා වැකි ඛණ්ඩ ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට සරිලන අයුරින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිසැකසුම් කර ඇත.

## 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල එක් එක් වසරේ මාර්තු 31 වන දින ශ්‍රී ලංකන් එයා ලයින්ස් ලිමිටඩ් ආයතනයේ සහ එහි පූර්ණ හිමිකාරීත්වය සතු ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් නැමැති අනුබද්ධ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අඩංගු වේ. වෙනත් අයුරකින් සඳහන් කර ඇති විට හැර අනෙකුත් සෑම අවස්ථාවලදීම සුසංගත ගිණුම් ප්‍රතිපත්ති යොදා ගනිමින් සමාගම විසින් වාර්තාකර ඇති පරිදිම වූ වාර්ෂික වාර්තාකරණයක් සහිත මූල්‍ය ප්‍රකාශ අනුබද්ධ සමාගම විසින්ද පිළියෙල කර තිබේ.

සියලුම අන්තර් සමූහ ව්‍යාපාර ශේෂ, ගණුදෙනු, ආදායම් හා වියදම්, ලාභ/අලාභ සහ අන්තර් සමූහ ව්‍යාපාර ගණුදෙනු හේතුවෙන් උද්ගත වූ ලාභාංශ සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබ ඇත.

අනුබද්ධ සමාගම එය සංස්ථාපනය කළ දින සිටම සම්පූර්ණ වශයෙන්ම සමාගම හා ඒකාබද්ධ වී ඇත. එම සංස්ථාගතකළ දිනයේ සිට අදාළ පාලනය ඇරඹී එය නතර වන දිනය දක්වා එකී අනුබද්ධ සමාගම, සමාගම සමඟ ඒකාබද්ධ වී නොකඩවා පවතිනු ඇත.

## 2.3 වැදගත් ඇස්තමේන්තු හා උපකල්පන

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ රපෝර්තු දිනයට සිදුවූ හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑ හැකි නිගමනයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන නිගමනයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුනු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් වන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුගතව සාධාරණ යැයි විශ්වාසකරන අනාගත සිදුවීම් වල මතු අපේක්ෂාද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

පහත දැක්වෙන නිගමන ඇස්තමේන්තු හා උපකල්පන, විෂයික වන්නා වූ මෙන්ම මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනෙන මුදල් ප්‍රමාණ මත වැදගත් බලපෑමක් ඇති කරන්නා වූද අනෙකුත් කරුණු අතර යෙදේ.

## (අ) නිගමන

### i. අවිනිශ්චිත බැරකම් - නඩු කටයුතු

24 වන සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ අවසානය වන විට විවිධ පාර්ශවකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ තීන්දු අපේක්ෂාවෙන් සිටියේය. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේ ද උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කෘත්‍යයේ යුක්ත යුක්ත බව ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සිදුවිය හැකි සම්පත් විගලනයක් පවතී යැයි නිශ්චය කළ හොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද සිදු කරනු ලබයි.

### ii. ක්‍රියාකාරී කල්බදුකර

ගුවන් යානා හා එන්ජින් වලට අදාළව වානිජ කල්බදු ගිවිසුම් වලට සමාගම එළඹ සිටී. එම වත්කම් වල හිමිකාරීත්වයට අනුෂංගික වූ සියළුම වැදගත් අවදානම් දැරීම් හා විපාක සමාගම විසින් රඳවා ගනු නොලබන බව හා සමාගමේ දේපළ, පිරියත හා උපකරණ වල කොටසක් ලෙස ඒවා නොගැනෙන බව තහවුරු වූ විට එකී ගිවිසගත් නියමයන් හා කොන්දේසි මත ක්‍රියාකාරී කල්බදුකර හඳුනාගැනේ.

## (ආ) ඇස්තමේන්තු

### i. දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම් වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරා දෙනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ප්‍රයෝජ්‍ය ආයු කාලයද එක් එක් ශේෂ පත්‍රයේ දිනට ඒවායේ ක්ෂය වීම් ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම්හි පූර්ව ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභ වල පරිභෝජන රටාව සමඟ එය සුසංගත වන බවටද වග බලා ගනියි. මෙම වත්කම් වල ප්‍රයෝජ්‍ය ආයු කාලය හා අවශේෂ වටිනාකම් අතර වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සමාලෝචන වලට හේතු විය හැකිය.

### ii. මහා පරිමාණ ගුවන් යානා එන්ජින්වල මහා පරිමාණ අලුත්වැඩියා පිරිවැය හිලව්කිරීම

එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසි වලට අනුව ගුවන් යානා එන්ජින් හා ඒවායේ ගොඩබැසුම් උපකරණ පිළිබඳව සූක්ෂම නඩත්තු පරීක්ෂා කටයුතු ඉටු කිරීම කළමනාකරණය විසින් කළයුතුව තිබේ. එකී පරීක්ෂා කිරීම් සම්පූර්ණ වීමෙන් පසුව හා එම වත්කම් පරිහරණය පිණිස සූදානම් තත්ත්වයට පැමිණි විට සමාගම ඊට අදාළ පිරිවැය ප්‍රාග්ධනිත කරයි. එසේ ප්‍රාග්ධනිත කළයුතු පිරිවැය පදනම් වනුයේ විකුණුම්කරුගේ ඉන්වොයිස් පත්‍ර රහිත පවත්නා හොඳම ඇස්තමේන්තු මතය. එහිලා එකී පරීක්ෂා කිරීම් සඳහා එකඟත්වයට පත්වූ ණය සටහන්පත් සහ කළින් ගෙවූ අරමුදල් ද සැලකිල්ලට ගැනේ. දරන ලද මුදලෙහි වටිනාකම හා ප්‍රාග්ධනනිත කරන ලද

මුදලෙහි වටිනාකම අතර යම් වෙනසක් වේනම්, එය එබඳු වෙනස් කම් වැදගත් නොවේ යැයි සලකනු ලබන අවස්ථාවකදී ප්‍රලෝකනාත්මකව ක්‍රියාවට නැංවේ. ඉන් අනතුරුව එබඳු පිරිවැය එකී සූක්ෂ්ම නඩත්තු පරීක්ෂාවන්හි කාලසීමාව හා බදුකරයේ ඉතිරි වලංගු කාලසීමාව අතර පවත්නා ඇස්තමේන්තුගත පියාසර පැය ගණනට/චක්‍රවලට අයත් කෙටිම කාල පරිච්ඡේදය එල්ලේ හිලව් කරන ලැබේ.

### iii. උපයෝජනය නොකළ ගුවන් මගී ප්‍රවේශපත්

ප්‍රවාහනය සැපයෙන අවස්ථාවේදී සිදුවන මගී හා ගුවන් බඩු විකුණුම්, මෙහෙයුම් ආදායම් වශයෙන් හඳුනා ගැනේ. භාවිතයට නොගත් ප්‍රවේශපත් හා ගුවන් බිල්පත් වල වටිනාකම ජංගම බැරකම් තුළ ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ඇතුළත් කෙරේ. භාවිතයට නොගත් ප්‍රවේශපත් හා ගුවන් බිල්පත් වල වටිනාකම පූර්ව විනිශ්චිත කාලසීමාවකින් පසුව අවලංගු වී නොතිබුණහොත් ආදායමක් සේ සැලකේ. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුල එකී කාලසීමාව ඉකුත් වසරේ ඇස්තමේන්තුව වූ වසර දෙක සිට එක් වසර දක්වා ප්‍රතිශෝධනය කර තිබේ. විවර්ධිත පද්ධති කර්තව්‍යයන්ගේ සිට උද්ධෘත කූපන්පත් අනුව වූ අගයද, නියමයන් හා කොන්දේසි,ඓතිහාසික ප්‍රවනතා, සංචාරක රටාවේ වෙනස්කම් සහ ආර්ථික වාතාවරණය යන කරුණු ද ඇතුළත් සාධක ගණනාවක් අදාළ තීරක කාලපරිච්ඡේදය නිගමනය කිරිම සඳහා කළමනාකරණය විසින් සලකා බලා ඇත. එකී ඇස්තමේන්තු වෙනස්කම් වල බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 23 වන සටහනෙහි හෙළිදරව් කර තිබේ.

### iv. නිරන්තර පියසර වැඩසටහන

සමාගම ‘ෆ්ලයිස්මයිල්ස්’ නැමැති නිරන්තර පියසර වැඩසටහනක් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබන අතර, එමගින් එහි සාමාජික සාමාජිකාවන් සඳහා ඔවුන්ගේ එකතු වන මුළු සැතපුම් ප්‍රමාණය පදනම් කරගෙන සංචාරක ප්‍රදාන පිරිනමයි. නිරන්තර පියසර ප්‍රතිලාභ උපයෝජනයට ගැනෙන තෙක් ප්‍රදාන වලට අදාළ මගී ආදායමෙන් කොටසක් විලම්බනය කර තැබේ. ආදායම් විලම්බනය ඇස්තමේන්තු කෙරනුයේ අදාළ බැර ප්‍රදාන නිදහස් කර ගැනීමේ ඓතිහාසික ප්‍රවනතාවයේ පදනම මත පිහිටා වන අතර, එය එකී ප්‍රතිලාභ වලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකථනය පිණිස යොදා ගැනේ. ප්‍රදානය කරනු ලබන බැරෙහි සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කර ගත හැකි සේවා වල සාධාරණ අගයට සැඳහුම් දක්වමිනි. ඇස්තමේන්තු එක් එක් ශේෂ පත්‍රයේ දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ බැරකම් ඒ අනුව ගලපනු ලැබේ. එකී ඇස්තමේන්තු වෙනස්කම් වල බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 23 වන සටහනෙහි හෙළිදරව් කර තිබේ.

### V. නඩත්තු සංචිතය

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් බදුකර යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය ගණන අනුවය. ආපසු අයකර ගත යුතු මෙම මුදල් ප්‍රමාණ වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් ආපසු අය කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව

කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. ආපසු අයකර ගැනීමේ හැකියාව අඩමාන වේ නම් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.

### vi. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාන්ඩ වල පැවැත්ම හා ප්‍රයෝජ්‍යතාවය නිත්‍ය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කිරීමේ පදනමක පිහිටා සමාගම සමාලෝචනය කරයි. එම භාණ්ඩ වල ආපසු අයකර ගත හැකි වටිනාකමෙහි අඩුකිරීමක් ලෙස යල් පිනූ තොග සහ/හෝ වත්කම් සම්බන්ධයෙන් කළමනාකරණය නිගමනය කළ විට ඒ සඳහා ප්‍රතිපාදන සැපයේ.

### Vii. අඩමාන ණය සඳහා ඉඩ හැරීම

සමාගම සෑම ශේෂ පත්‍ර දිනයකදීම ආදායම් ප්‍රකාශය තුළ දීමනා ඉඩ හැරීමක් සටහන් කළ යුතු දැයි සලකා බැලීම සඳහා සියලුම ලැබීම් නියමිත සමාලෝචනයකට හසු කරයි. අඩමාන ණය පරිශේෂව පවත්නා කාලසීමාවත්, ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිත භාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණයද දන්නා වෙනත් සාධකත් එම දීමනා ඉඩ හැරීම් ඇස්තමේන්තු කිරීමෙහිලා ස්වකීය නිශ්චයමතිය තුළ පිහිටා කළමනාකරණය විසින් පාවිච්චි කරනු ලබයි.

## (ඇ) උපකල්පන

### (i) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලය වලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය නිශ්චය කෙරෙනුයේ ආයුගණක තක්සේරුවක් යොදා ගනිමිනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය, විශේෂ වාරික මුදල, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගම ව්‍යාපාරිකව ක්‍රියාත්මකවීමේ තත්වය යන කරුණු වලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ.

### (ii) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ප්‍රත්‍යාගණනිත අගය මත දේපළ, පිරියත සහ උපකරණ වල වටිනාකම ගණන් බලනු ලැබේ. සාධාරණ අගයක් නිශ්චය කිරීම පිණිස එකී තක්සේරුකරු උපකල්පන සහ තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරයි. සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් කොටස් ආයෝජන ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමාගමේ ව්‍යාපාරික කටයුතු ඉටුකිරීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙණු,

ඒවා සිදුවන දිනයට වලංගු ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් සටහන් කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන මූල්‍ය වත්කම් හා බැරකම් ශේෂපත්‍රයේ දිනයට වලංගුව පවත්නා ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශය මගින් හඳුනා ගැනේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැය ප්‍රකාරව ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

## 2.4.2 බදුකරණය

### (i) ප්‍රවර්තන ආදායම් බදු

**සමාගම**

### (අ) දේශීය බදුකරණය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1994 අගෝස්තු මාසයේදී 'සමාගමට' 'ෆ්ලැග්ෂිප්' තත්ත්වය ප්‍රදානය කරන ලද අතර, එමගින් එතෙක් සමාගම අත්විඳි බදු නිදහස 1998 මාර්තු 31 වන දින දක්වා දීර්ඝ කරන ලදි. 1998 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2013 දින දක්වා තවදුරටත් බදු නිදහස් කාල සීමාවක් සමාගම වෙත ප්‍රදානය කළේය. 2011 පෙබරවාරි මාසයේදී ස්වකීය සියලුම ව්‍යාපාරික කටයුතු සඳහා 2011.04.01 සිට 2021.03.31 දක්වා ක්‍රියාත්මක වන දස අවුරුදු බදු නිදහස් කාලයක් 2011 අංක 22 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ විධිවිධාන යටතේ සමාගම වෙත ලැබුණි.

### (ආ) එතෙර බදුකරණය

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ ස්වකීය විදේශීය ව්‍යවහාර මෙහෙයුම් කටයුතු මත සමාගම බදු ගෙවනු ලැබීමට යටත්වේ . කෙසේ වුවද, සමාගම අත්විඳි ඉදිරියට ගෙනගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම සම්බන්ධ කිසිදු බදු බැඳියාවක් නොමැත.

**අනුබද්ධ සමාගම - ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්**

ආදායම් බදු වියදම් හි ප්‍රවර්තන හා විලම්බිත බදු අඩංගු වේ. කොටස් ආයෝජනයන් තුළ ඍජුවම හඳුනාගැනෙන අයිතමයන්ට ලාභය හෝ අලාභය අදාළ වන තාක් දුරට හැරුණු විට ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ. එහි ලා එය හඳුනාගැනෙනුයේ කොටස් ආයෝජනය තුළය.

ප්‍රවර්තන බදු යනු රපෝර්තු දිනයට පනවා ඇති හෝ ස්ථාවරව පනවා ඇති බදු අනුප්‍රමාණ උපයෝගී කර ගනිමින් වර්ෂය සඳහා වූ බදුවන ආදායම් මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද සහ ඉකුත් වර්ෂ සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු වෙනුවෙන් සිදු කරනු ලබන යම් ගැළපුම් වේ.

ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව, යානාස්ථ මුළුතැන් ගෙවල් වලින් හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හලෙන් උද්ගත වන ආදායම 2021 මැයි මස 31 වන දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් ප්‍රභවයන් වෙතින් උද්ගත වන ආදායම සාමාන්‍යා බදු අනුප්‍රමාණ අනුව බද්දට යටත්වේ.

**(ii) විලම්බිත ආදායම් බදු**

වත්කම් හා බැරකම් බදුමූලයන් හා ඒවායේ මූල්‍යමය වාර්තාකරන කාර්යයන් සඳහා ඉදිරියට ගෙනයනු ලබන ගණන් ප්‍රමාණ අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳව බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදනය කෙරේ.

**සමාගම**

සමාගම එහි බදු විරාම කාලසීමාව තුළ පසුවන හෙයින් දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවන අතර, අදාළ තාවකාලික වෙනස්කම් බද්දෙන් නිදහස් කාලපරිච්ඡේදය තුළ උද්ගත වන්නේද නැත. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශ වල විලම්බිත බදු කිසිවක් ප්‍රතිපාදනය කර නොමැත.

**අනුබද්ධ සමාගම - සී/ස ශ්‍රී ලංකන් කේටරින් සමාගම**

මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා ඉදිරියට ගෙනයනු ලබන වත්කම් හා බැරකම් වල ගණන් ප්‍රමාණ සහ බදුකරණ කාර්යයන් සඳහා උපයෝගීකර ගැනෙන ගණන් ප්‍රමාණ අතර තාවකාලික වෙනස්කම් සඳහා ප්‍රතිපාදන සලසා ශේෂපත්‍රය භාවිතා කරමින් විලම්බිත බදු හඳුනාගැනේ. ප්‍රතිපාදනය කරනු ලැබ ඇති විලම්බිත බදු ප්‍රමාණය පදනම් වනුයේ ශේෂපත්‍ර දිනට පනවා ඇති හෝ ස්ථිරව පනවා ඇති බදු අනුප්‍රමාණ උපයෝගී කර ගනිමින් ඉදිරියට ගෙනයනු ලබන වත්කම් වල හා බැරකම් වල උපලබ්ධි වීමේ හා නිරාකරණය වීමේ අපේක්ෂිත ආකාරය මතය.

ප්‍රධාන තාවකාලික වෙනස්කම් උද්ගත වනුයේ දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම ඉදිරියට ගෙන ගිය බදු අලාභ සහ නිශ්චිත ප්‍රතිලාභ ආශ්‍රිත බැඳීම් සඳහා වූ ප්‍රතිපාදන යන කරුණු ඔස්සේය.

ඉදිරියට ගෙනයනු ලබන අභාවිත වන අලාභ වලට අදාළ විලම්බිත වත්කම් හඳුනා ගැනෙනුයේ අනාගත බදුවල අලාභය එල්ලේ අභාවිත බදු අලාභ උපයෝගී කරගෙන ඇති ප්‍රමාණය අනුමාන යැයි සැලකෙන දුර ප්‍රමාණය දක්වාය.

විලම්බිත බදු වත්කම් හඳුනාගැනෙනුයේ අනාගත බදුවල අලාභය එල්ලේ අභාවිත බදු අලාභ උපයෝගී කරගත හැකි එකී අනාගත බදුවන අලාභයේ ප්‍රමාණය අනුමාන යැයි සැලකෙන දුර ප්‍රමාණය දක්වාය. විලම්බිත බදු වත්කම් ශේෂ පත්‍රයේ දිනට සමාලෝචනය කෙරෙන අතර ඊට අදාළ බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් අනුමාන නොවේ යැයි සලකනු ලබන දුර ප්‍රමාණයක් දක්වා අඩු කෙරේ.

## 2.4.3 දේපළ, පිරියත හා උපකරණ

### (අ) පිරිවැය හා තක්සේරුකිරීම

දේපළ, පිරියත හා උපකරණ යනාදී සියළුම අයිතම ප්‍රාරම්භක වශයෙන් සටහන් කෙරෙනුයේ ගත් මිලටය. අත්කරගැනීම් හෝ ඉදිකිරීම්හි ලා ඍජුව ආරෝපනය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණ යනාදී අයිතම පසුව ප්‍රත්‍යාගණනය කිරීමේදී ඒවා පසු අවස්ථාවක සිදුවන යම් ක්ෂයවීම් හා දුබලතා ඌණ ප්‍රත්‍යාගණනිත ගණන් ප්‍රමාණ මත ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් හා/හෝ උපචිත දුබලතා අලාභ වෙතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත ප්‍රකාශ කෙරේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එය එකී වත්කමට අදාළ ඉකුත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය නොකරන්නේ නම් මිස, ඉදිරියට ගෙනයනු ලබන ගණන් ප්‍රමාණයෙහි යම් වැඩිවීමක් කලින් වියදමක් ලෙස හඳුනාගෙන තිබූ ප්‍රත්‍යාගණනිත අතිරික්තයක් වෙත ඍජුවම බැරකෙරේ. එබඳු අවස්ථාවකදී ඉකුත් කපා හැරීම් ප්‍රමාණය තෙක් වූ දුරකට අදාළ වැඩිවීම ආදායම වශයෙන් හඳුනාගැනේ. වත්කමක් සම්බන්ධයෙන් වූ ප්‍රත්‍යාගණනිත අතිරික්තයක ඉතිරිව පවත්නා ශේෂයක් වත්කම් ඉවත් කිරීමේ හෝ ව්‍යපහරණය කිරීමේ සමුච්චිත ලාභ ප්‍රමාණය වෙත ඍජුවම මාරු කර හරිනු ලැබේ.

ප්‍රත්‍යාගණනිත වත්කමක සාධාරණ අගය එහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකමෙහි විශාල වෙනසක් සිදුනොකරන බවට සහතික වනු පිණිස වත්කම් ආගණන කටයුතු නිරන්තරවම සිදු කෙරේ. ඉන්පසු උද්ගත වන පිරිවැයක් වේනම් එය අදාළ වත්කමෙහි ඉදිරියට ගෙනයන වටිනාකම තුළ අවස්ථාවෝචිත පරිදි අන්තර්ගත කෙරේ. එසේ නැතහොත් වෙනමම වත්කමක් ලෙස හඳුනාගැනේ. මෙවැන්නක් සිදුවනුයේ අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලාඒම අනුමාන වන කල්හිත්, අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් මැනිය හැකි කල්හිත් පමණි.

අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ. දේපළ, පිරියත හා උපකරණ වලට පහත සඳහන් දෑ අනෙකුත් කරුණු අතර ඇතුළත් වේ.

#### (i) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්

ස්පෘෂ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් ප්‍රාරම්භක වශයෙන් ගත්මිල අනුව සටහන් කර එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය එල්ලේ ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය ගුවන් යානා ආශ්‍රිත උපකරණ යටතේ කාණ්ඩ ගත කර ඇත.

#### (ii) කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ ගත් මිළ අනුව සටහන් කෙරේ. ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපන දිනය දක්වා දරන සියලු වියදම් ඊට ඇතුළත් වේ.වැඩ ස්ථාපනය කළ විට කෙරෙමින් පවත්නා වැඩ දේපළ, පිරියත හා උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තු ගත ප්‍රයෝජ්‍ය ආයු කාලය එල්ලේ ක්ෂය කරනු ලැබේ.

**(ආ) ක්ෂය වීම**

සින්නක්කර ඉඩම් හැරුණු විට සියලුම දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාල වකවානු පුරා දිවෙන පරිදි සමාන වාරික වලින් එකී ගණන් ප්‍රමාණ කපා හැරීමේ අටියෙන් ක්ෂය වීම් සඳහා වූ ප්‍රතිපාදන ආගණනය කරනු ලැබේ.

**ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්:**

වසර 08 ක් හෝ කල්බදු කාලසීමාව යන කාල දෙකෙන් අඩු කාලය මුළුල්ලේ.

**පිරියත හා උපකරණ:**

උපකරණයේ වර්ග මත පදනම්ව වසර 1 -10 දක්වා කාල පරිච්ඡේද මුළුල්ලේ.

**ගොඩනැගිලි:**

උපරිම වශයෙන් වසර 20 කට යටත්ව අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මුළුල්ලේ

දේපළ, පිරියත හා උපකරණ වල මුදල් වටිනාකම හා ඒවායේ ක්ෂය කිරීම් ක්‍රමය හා කාල පරිච්ඡේදය පූර්ව ඇස්තමේන්තු සමඟත්, ඒවායේ අයිතමයන් තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව සමගත් සුසංගත වන බවට සහතික වනු පිණිස ඒවායේ අවශේෂ අගය, ප්‍රයෝජ්‍ය ආයු කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය යන කරුණු එක් එක් ශේෂ පත්‍රයේ දිනට සමාලෝචනයට භාජනය කෙරේ.

**(ඇ) හඳුනානොගැනීම**

කිසියම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අත් නොවන කල්හි එම අයිතමය එහි ව්‍යපහරණයෙන් පසුව හඳුනාගනු නොලැබේ. යම් වත්කමක් එසේ හඳුනාගනු නොලැබීමෙන් උද්ගත වන ලාභයක් හෝ අලාභයක් වෙතොත් එය (ව්‍යපහරණයෙන් ගත් ශුද්ධ මුදල සහ වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස ලෙස ආගණනය කරන ලද) අදාළ වත්කම හඳුනා නොගන්නා වර්ෂයට අයත් මූල්‍ය ප්‍රකාශයෙහි අන්තර්ගත කෙරේ.

## 2.4.4 ගුවන් යානා නඩත්තු සංචිතය

ක්‍රියාත්මකව පවතින කල්බදු ගිවිසුම් අනුව ගුවන්යානා එන්ජින්, ගුවන් යානා සැකිලි සහ ගුවන් යානා අංගෝපාංග යනාදියෙහි අලුත්වැඩියා සඳහා මාසික පදනමක් මත කල්බදුකරුවන්වෙත කරන ලද ගෙවීම් වලින් ගුවන් යානා නඩත්තු සංචිතය සමන්විත වේ. අඩමාන ලැබීම් නියමිත සඳහා වූ ප්‍රතිපාදන රහිත ලැබීම් නියමිත වශයෙන් මෙකී

ගෙවීම් ශේෂ පත්‍රයෙහි සටහන් කෙරේ. ගුවන් යානා එන්ජින්, ගුවන් යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි (සංචිතය වෙත දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය දක්වා) අලුත්වැඩියා සඳහා දරන ලද වියදම අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අයකරගනී. ආපසු අයකර ගතයුතු මෙම මුදල් ප්‍රමාණ වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් ආපසු අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කළමනාකරණය කලින් කල අගැයීම් සිදු කරයි. ආපසු අයකර ගැනීමේ හැකියාව අඩමාන වේනම් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

## 2.4.5 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා උද්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එබඳු යම්වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකිවීම යන කරුණු අනුමාන වශයෙන් සලකනු ලබන්නේ නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගැනේ. ඒ අනුව මෙම වත්කම් ශේෂ පත්‍රයේ සඳහන් කෙරෙනුයේ සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත දුබලතා අලාභ වෙතොත් ඒවාද ඌණ වූ ගත් මිල මතය.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන්කර ගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ වියදම වෙන් වශයෙන් ප්‍රාග්ධනනය කරනු ලබන අතර එය සරල මාර්ග පදනම මත වසර 05 ක් නොඉක්මවන කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කෙරේ. ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය හා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් ශේෂපත්‍රයේ දිනට සමාලෝචනයට භාජනය කෙරේ. මෙම වත්කමේ ඉදිරියට ගෙන යන අගය ආපසු අයකරගත හැකිවිය නොවන්නක් බව යම් අවස්ථාගත සිදුවීම් හා වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් එකී අගය වත්කම් දුබලතා එල්ලේ කලින් කල සමාලෝචනය කෙරේ.

## 2.4.6 ප්‍රධාන ගුවන්යානා ඇන්ජින් අලුත්වැඩියා කිරීම

එක් කාල පරිච්ඡේදයකට වඩා ආර්ථික ප්‍රතිලාභ අනාගතයේදී සලසා දෙන ප්‍රධාන ගුවන් යානා ඇන්ජින් අලුත්වැඩියා වියදම් හා ගුවන් යානා ගොඩබෑමේ උපකරණ වියදම් හා පූර්ව අරමුදල් හා වොරන්ටි බලපත්‍ර වලට අදාළ හිමිකම් රහිතව ප්‍රාග්ධනනය කර ඊළඟ ප්‍රධාන අලුත්වැඩියාව තෙක් ඇස්තමේන්තු කළ පියාසර පැය ගණන්හි කාලය හා ඉතිරිව පවත්නා බදු කාලසීමාව යන දෙකෙන් අඩු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.4.7 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කරනු ලබන්නේ යල්පිනූ හා මන්දගාමීව චලනය වන අයිතම වලට නිසි ප්‍රතිපාදන සැපයීමෙන් පසුව ගණනය වන පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගය මතය. සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ බරතැබූ සාමාන්‍ය පිරිවැය පදනම මත ගණනය කෙරේ.

### 2.4.8 වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

බොල් හා අඩමාන ණය ලැබීම් නියමිත සඳහා ප්‍රතිපාදන රහිතව උපලබ්ධි වනු පිණිස ඇස්තමේන්තු කරනු ලබන ගණන් ප්රමාණ මත වෙළඳ ලැබීම් නියමිත ප්‍රකාශ කෙරේ. වෙනත් ලැබීම් නියමිත හා අදාළ පාර්ශව වෙතින් ලැබිය යුතු මුදල් බොල් ණය හා අඩමාන ණය ප්‍රතිපාදන ඌණ ගත්මිලට හඳුනාගැනේ.

### 2.4.9 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන් ගෙන හැර දක්වනුයේ බැංකුවේ ඇති මුදල්, අතැති මුදල් හා නිවේදිත තැන්පතු වශයෙනි. ඒවා, දන්නා මුදල් ප්‍රමාණ වලට වහා පරිවර්තනය කළහැකි හා වටිනාකම් වෙනස්කම් වලට නොවැදගත් අවදානම් වලට යටත් කෙටිකාලීන අධි ද්‍රවශීල ආයෝජන වශයෙන්ද ගෙනහැර දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල් සාම්‍යයනට බැංකුවේ හා අතැති මුදල් ද හිඟ හිට ඇති බැංකු අයිරා රහිත බැංකුවේ ඇති නිවේදිත තැන්පත් ද ඇතුළත් වේ. කෙටි කල්පිරීමේ කාලයක් සහිත ආයෝජනද (එනම්, අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සාම්‍යයන් ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කෙරෙනුයේ ශේෂ පත්‍රය තුළ බැරකම් දරන පොළී යටතේය.

### 2.4.10කල්බදුකර

#### (අ) ක්‍රියාකාරි කල්බදුකර

කල්බදුකරයේ කාලසීමාව තුළ සන්තකභාවයට අයත් සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අයුරින් කල්බදුකරු විසින් යෝග්‍ය අයුරින් රඳවා ගැනෙන බදුකර ක්‍රියාකාරී බදුකර ලෙස සැලකේ. ක්‍රියාකාරී බදු කර ලෙස සිදුකරනු ලබන ගෙවීම් ඒවා ගෙවීමට නියමිත අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගැනේ.

ප්‍රතිවින්‍යාසගත කිරීමේ වියදම් ප්‍රාග්ධනනය කරනු ලැබූ ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ඉතිරිව පවත්නා බදුකර කාලය යන දෙකෙන් අඩු කාල සීමාව එල්ලේ හිලව් කරනු ලැබේ.

#### (ආ) මූල්‍ය බදුකර

බදු දුන් අයිතමයේ අවදානම් හා එහි සන්තකභාවයේ අනුෂංගික වූ ප්‍රතිලාභ යෝග්‍ය පරිදි සමාගම වෙත පවරා දෙනු ලබන බදුකර, බදු දුන් දේපළෙහි සාධාරණ අගය හෝ ඊට වඩා අඩු අගයක් ගන්නේ නම්, අවම බදුකර ගෙවීම් වල වටිනාකම අනුව බදුකරයේ සමාරම්භක අවස්ථාවේදීම ප්‍රාග්ධනනය කෙරේ. ප්‍රාග්ධනනිත බදු දුන් වත්කම්, දේපළ, පිරියත හා උපකරණ යනුවෙන් අනාවරණය කරන අතර, බදුදුන් විෂයාංග ක්ෂය කෙරේ. 2.4.3 දරන ගිණුම් ප්‍රතිපත්තිය බලන්න.

අනුරූපී කල්බදුකර බැඳීම් බැරකම් යටතේ අන්තර්ගත කෙරේ. කල්බදු ගෙවීම්හි ප්‍රාග්ධනය හා පොළී මූලාංශ සමන්විත වෙතැයි සැලකේ. බැරකම්හි ඉතිරිව පවත්නා

ශේෂ මුදල මත ස්ථායි වාරමය පොළී අනුපාතයක් උපදවාගත හැකි වන පරිදි පොළී මූලාංශය කල්බදුකරයේ කාලසීමාව මුළුල්ලේ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

**(ඈ) විකිණීම හා ආපසු බදුදීම**

විකුණුම් හා ආපසු බදුදීම් සම්බන්ධ ගණුදෙනු නිසා ජනනය වන ක්‍රියාකාරී බදුකරයක් මත උද්ගත වන ලාභ, එකී විකුණුම් වලින් ලැබෙන මුදල් අදාළ වත්කම් වල සාධාරණ අගය නොඉක්මවන තාක් දුරට ආසන්න මට්ටමකින් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

**(ඇ) විලම්බිත එන්ජින් වැඩිදියුණු කිරීමේ පිරිවැය**

ක්‍රියාකාරී ගිවිසුම් වලට අදාළ ප්‍රතිලාභ කොන්දේසි වලට අනුකූල වූ විලම්බිත එන්ජින් වැඩිදියුණු කිරීමේ පිරිවැයෙහි ප්‍රවර්තන අගය ජංගම නොවන වත්කම් වල කොටසක් ලෙස ඇතුළත් කෙරෙන අතර, වත්කමෙහි ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 අනුව ගණනය කළ හා ශේෂ පත්‍රයෙහි වෙනත් විලම්බිත බැරකම් යටතේ කාණ්ඩගත කළ අනුරූපී බැරකම් සහිත වූ බදුකර කාලපරිච්ඡේදය යන දෙකින් අඩු කාල සීමාව එල්ලේ එකී අගය හිලවු කෙරේ.

## 2.4.11 ආයෝජන

**(අ) භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය:**

භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය සටහන් කෙරෙනුයේ අදාළ බැඳුම්කරයේ කාලසීමාව මුළුල්ලේ කල් පිරීම දක්වා වූ ලාභයේ පදනම මත වට්ටම් ඌණ පිරිවැය මතය. ඒවා ස්ථිරව පවතිනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම් පමණක් අගය හීනවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

**(ආ) අනුබද්ධ සමාගමේ ආයෝජනය:**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ, අනුබද්ධ සමාගම ආශ්‍රිතව සිදුකෙරුණු ආයෝජන ගිණුම්ගත කර ඇත. එය, තාවකාලිකව සිදුවන්නක් නොවන අගය හීනවීම් කිසිවක් සඳහා වූ යම් ප්‍රතිපාදන වලින් තොරය.

**(ඇ) වෙනත් දිගු කාලීන ආයෝජන:**

වෙනත් දිගු කාලීන ආයෝජන සටහන් කෙරෙනුයේ පිරිවැය අනුවය. ආයෝජනයේ පිරිවැය යනු අත්කර ගැනීමේ පිරිවැය වේ. ඉදිරියට ගෙන යනු ලබන ගණන් ප්‍රමාණ එක් එක් ආයෝජනයක් සඳහා වෙන් වෙන්ව නිශ්චය කරන තාවකාලික නොවන යම් පිරිහීමක් හඳුනාගැනීම සඳහා අඩු කෙරේ.

### 2.4.12 මූල්‍යමය නොවන වත්කම් දුබල වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වූ බවට සඳහනක් ඇත්දැයි සමාගම එක් එක් රපෝර්තු දිනයේදී ඇගයුමක් කරයි. එබඳු යම් සඳහනක් වෙතොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වන කල්හි හෝ වත්කමෙහි ආපසු අයකර ගතහැකි මුදල පිළිබඳව සමාගම ඇගයීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ගිය හැකි වටිනාකමේ ප්‍රමාණය එය ආපසු අයකර ගත හැකි ගණනෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලත්වයට පත්ව ඇතැයි සලකනු අතර, එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා කපා හැරේ.

### 2.4.13 ප්‍රතිපාදන

ප්‍රතිපාදන හඳුනා ගැනෙනුයේ සමාගම විසින් වගකිවයුතු කිසියම් ප්‍රවර්තන බැඳීමක් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත යම් සම්පත් විගණනයක් අවශ්‍ය වෙතැයි හෝ එකී බැඳීමේ වටිනාකම අළලා විශ්වාසදායක ඇස්තමේන්තුවක් සැදීමට හැකි වෙතැයි හෝ අනුමාන කෙරෙන කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව එබඳු යම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදීය.

ප්‍රතිපාදන සමහරක් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කළයුතු යැයි සමාගම අපේක්ෂා කරන්නේ නම් වෙනමම වත්කමක් ලෙස එකී ප්‍රතිපූර්ණය හඳුනා ගැනෙන මුත් එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත වූ විට පමණි. මොනයම් හෝ ප්‍රතිපාදනයකට අදාළ වියදම් ප්‍රතිපාදන කිසිවකින් තොරව ආදායම් ප්‍රකාශය තුළ ගෙන හැර දැක්වේ. මුදලෙහි කාලීන වටිනාකම හා බැඳුනු බලපෑම වැදගත් වනුයේ නම්, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ බදු පූර්ව අනුපාතයකට අනුව වට්ටම් කර ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ. එකී බදු පූර්ව අනුපාතයෙහි මුදලේ කාලීන වටිනාකම හා බැඳුනු වෙළඳපොළ තක්සේරුව හා අදාළ අවස්ථාවන්හි බැරකම් හා නිශ්චිතව බැඳුනු අවදානම් නිරූපනය වියයුතු යැයි සැලකේ.

එලෙස වට්ටම් කිරීමක් යොදා ගැනෙන කල්හි ඇවර නොකිරීමේ බලපෑම් හේතුවෙන් ප්‍රතිපාදනයෙහි උද්ගත වන යම් වෙනස්කම් ආදායම් ප්‍රකාශය ඔස්සේ ගණනය කෙරේ.

### 2.4.14 කාබන් විමෝචනය

යුරෝපා සංගමයේ විමෝචන වෙළඳ කටයුතු යෝජනා ක්‍රමය (“EU ETS”)පාලනය වන නියෝග යටතේ 2012 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන් වෙතින් ආරම්භ වෙන හෝ ඒවා වෙත ගොඩබාන ගුවන් යානා හිමි ගුවන් සමාගම්,$CO_2$ (කාබන් ඩයොක්සයිඩ්) විමෝචනය අධීක්ෂණය කර වාර්ෂිකව ඒ පිළිබඳව වාර්තා කළ යුතු අතර එම වසරට අදාළව ඔවුන්ගේ $CO_2$ විමෝචනයට සමාන වූ විමෝචන දීමනා ප්‍රමාණයක් සෑම වසරකදීම අදාළ රජයට වාර්ෂිකව ලබා දීමටද බැඳී සිටී. මෙම යෝජනා ක්‍රමය යටතේ ගාස්තු රහිත මූලික විමෝචන දීමනාවක් සමාගම වෙත වෙන් කර දෙනු ලබන අතර එම නොමිලේ ලබා

දෙන දීමනාවට වඩා වැඩිවන යම් අතිරේක විමෝචනයක් වෙතොත්, එම අතිරේක ප්‍රමාණය සඳහා අතිරේක දීමනා (බැර) මිලදී ගැනීමේ වගකීමෙන් සමාගම බැඳේ. තත්‍ය විමෝචන ප්‍රමාණය තම සන්තකයේ පවත්නා විමෝචන බැර ප්‍රමාණය ඉක්මවන විට ඊට අදාළ බැරකම සමාගම විසින් හඳුනාගනු ලබනවා ඇත. ශේෂ පත්‍රයේ දිනට උපයෝජනය නොකළ අදාළ විමෝචන බැර ප්‍රමාණය $CO_2$ටොන් 228,215 ක් වශයෙන් ගණනය වේ.

### 2.4.15 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### (අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වන ප්‍රතිඥාත පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ වල ප්‍රවර්තන අගය සැම වසරකම ජීව ගණකාධිකවරයෙකුගේ උපදෙස් සහිතව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදා ගනිමින් සමාගම විසින් ගණනය කරනු ලබයි.

ජීව ගණකාධිකවරයා විසින් යොදා ගනු ලබන ප්‍රධාන උපකල්පන වලට පහත සඳහන් දෑ ඇතුළත්ය.

| | සමාගම | | අනුබද්ධ සමාගම | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 |
| i) පොලී අනුපාතිකය | 11% | 10% | 10% | 12% |
| ii) වැටුප් වර්ධක අගය | | | | |
| -ශ්‍රී ලං.රු. | 10% | 10% | | |
| -ඇ.ඩො. | 2% | 2% | | |
| -විධායක | | | 10% | 10% |
| -විධායක නොවන | | | 20% | 17% |
| iii) විශ්‍රාම වයස - අවුරුදු | 60 | 60 | 55 | |
| iv) ආයතනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව | | | | |

පාරිතෝෂිත බැරකම් බාහිර ලෙසින් අරමුදල් ලබා නොගනී. මෙම අයිතම ශේෂපත්‍රයෙහි 'වෙනත් විලම්බිත බැරකම්' යටතේ කාණ්ඩගත කර ඇත. එතෙර ස්ථානගතව රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම යටතේය.

#### (ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සේවා නියුක්තකයන් අදාළ අණපනත් හා රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සුදුසුකම් ලබා සිටී. සේවක දළ පාරිශ්‍රමික ප්‍රමාණයෙන් 15% ක් හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සමාගම විසින්ද, 12% ක් හා 3% ක් වූ ප්‍රමාණය අනුබද්ධ සමාගම විසින් ද දායක කරයි.

### 2.4.16 නිරන්තර පියසර වැඩසටහන

"ෆ්ලයිස්මයිල්ස්" යනුවෙන් හඳුන්වනු ලබන නිරන්තර පියසර වැඩසටහනක් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමගින් වැඩසටහනේ සාමාජිකයන්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදාන පිරිනමයි. මෙම "ෆ්ලයිස්මයිල්ස්" වැඩසටහනේ ප්‍රතිලාභ වලට අදාළ මගී ආදායමෙන් කොටසක්, ඒවා උපයෝජනයට ගනු ලබන තෙක්එම ප්‍රතිලාභ අපේක්ෂිත උපයෝජනය මත පදනම්ව ඇස්තමේන්තු කර විලම්බනය කර තැබේ.

උපචිත සැතපුම් ප්‍රමාණයේ අපේක්ෂිත නිදහස් කරගැනීම් වලට අදාළ උපකල්පන සමාගම විසින් වසර තුළදී 60% සිට 50% දක්වා වූ ප්‍රමාණයකින් සමාලෝචනයට භාජනය කරන ලදි.

### 2.4.17 ආදායම් හඳුනාගැනීම

**සමාගම**

**(අ) ගුවන් සමාගමේ ආදායම**

ප්‍රධාන වශයෙන් ආදායම ජනනය කර ගැනෙනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු හා තැපැල් ප්‍රවාහනය, ගුවන් තොටුපළ පර්යන්ත සේවා සැපයීම, ඉංජිනේරු සේවා සැපයීම හා ආශ්‍රිත සේවා යනාදිය මගිනි. අන්තර් සමාගම් ගණුදෙනු සමාගම සඳහා වූ ආදායමෙන් බැහැර වේ.

(i) ගුවන් මගී ගුවන් බඩු විකුණුම් හඳුනා ගැනෙනුයේ ප්‍රවාහනය සපයන අවස්ථාවලදී උද්ගතවන මෙහෙයුම් ආදායම් වශයෙනි.

(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත් වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම බැරකම්හි ඇතුලත් කෙරේ. අභාවිත හා ගුවන් මාර්ග බිල්පත් වල අගය හඳුනාගැනෙනුයේ එක් වසරකට පසුව භාවිතයට නොගෙන පවතින්නේ නම්, ආදායම වශයෙනි.

(iii) තෘතීය පාර්ශව නඩත්තු සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.

(iv) ගුවන් ගමන් මෙහෙයුම් සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ අදාළ සේවා ඉටු කිරීමෙන් පසුවය.

**(ආ) ලාභාංශ ආදායම**

කොටස් හිමියන් අදාළ ගෙවීම් ලැබීමට ඇති ඔවුන්ගේ අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

**(ඇ) කුලී ආදායම**

කුලී ආදායම හඳුනාගැනෙනුයේ උපචිත පදනමක් මතය.

**(ඉ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් හඳුනාගැනෙනුයේ උපචිත පදනම මතය.

**අනුබද්ධ සමාගම - ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ්**

**භාණ්ඩ විකිණීම**

සන්තකභාවයට අදාළ සැලකිය යුතු අවදානම් හා ලැබීම් දීමනා ගැනුම්කරු වෙත පවරනු ලැබ ඇති විට ආදායම හඳුනා ගැනේ. අගය එකතු කළ විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර, ආදායම නිශ්චය කරනුයේ වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසුවය. ප්‍රතිෂ්ඨා මුදල්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් හා භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතා වේනම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

## 2.14.18වියදම් හඳුනාගැනීම

නිශ්චිත ආදායම් අයිතම වල දරන ලද පිරිවැය හා ඉපයුම් අතර පවත්නා ඍජු සබඳතාවක පදනම මත පිහිටා ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගැනේ. කාර්යක්ෂම තත්වයන් යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීම යන කාර්යයන්හි ලා දරන ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, "වියදම්හි ක්‍රියාකාරීත්වය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇත. එසේ එම ක්‍රමය අනුගමනය කර ඇත්තේ, සමාගමේ හා සමූහයේ කාර්ය සාධනය පිළිබඳව මූලාංශ එමගින් සාධාරණ අයුරින් ගෙනහැර දැක්වෙතැයි යන පදනම මතය.

## 2.4.19 ණයගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය හඳුනා ගැනෙනුයේ, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් එහි අපේක්ෂිත භාවිතය හා විකිණීම පිණිස සූදානම් කෙරෙන සැලකිය යුතු කාලසීමාවක් දක්වා එලෙස යම් වත්කමක් අත්කර ගැනීමට, ඉදිකිරීමකට හෝ නිපදවීමකට ඍජුවම අදාළ වන පරිදි එකී ණයගැනුම් පිරිවැය උද්ගතවන තාක් වූ දුර හැරුණු විට ඒවා එලෙස දරනු ලබන කාලසීමාව දක්වා වූ දුරකට ගැනෙන වියදමක් වශයෙන් වන අතර එය එකී වත්කමෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනනය කරනු ලැබේ.

## 2.4.20 ඛණ්ඩමය වාර්තාකරණය

ඛණ්ඩයක් යනු ව්‍යාපාර සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයකි. වෙනත් අංශ වලට වඩා වෙනත් ස්වරූපයක් ගත් අවදානම් හා ලැබුම් දීමනා වලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ කාර්යන්හි ලා එම අංශය නිරත වේ.

සමාගමේ අවදානම් හා ලාභ අත්කර ගැනීමේ අනුපාතය කෙරෙහි සමාගම විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටු කරන්නේය යන සාධකය ප්‍රබල ලෙස බලපෑම් ඇති

කරන්නක් හෙයින් එකී මෙහෙයුම් කටයුතු වල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ නිශ්චය කරනු ලැබේ. විකුණුම් උත්පාදනය මගින් සලසා ගැනෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම සිදු කළ කලාපය වෙත ආදායම වෙන් කිරීම මගිනි. කිසියම් විශේෂ ඛණ්ඩයකට යටත් කොට ඍජුවම හඳුනා ගත නොහැකි වියදම් වෙන්කර දක්වමින් හෙළිදරව් කිරීමක් සිදු නොවේ.

භූගෝලීය ඛණ්ඩ වෙත වත්කම් හා අදාළ බැරකම් වෙන්කර දීමේ යෝග්‍ය පදනමක් මත නොපවතී යයි කළමනාකරණය හඟියි. ඒ අනුව ඛණ්ඩමය වත්කම්,ඛණ්ඩමය බැරකම් සහ ගෝලීය ඛණ්ඩ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් හෙළිදරව් නොකෙරේ.

ව්‍යාපාරික ඛණ්ඩය අනුව ද්විතීයික වාර්තාකරණය පදනම් වනුයේ සමූහය විසින් සලසනු ලබන සේවාවන්හි ස්වභාවය මතය. සමූහය ප්‍රධාන ව්‍යාපාර ඛණ්ඩද්වයක නිරතව සිටියි. එනම්, ගුවන් ප්‍රවාහන කටයුතු වල සහ සිය අනුබද්ධ සමාගම ඔස්සේ ගුවන් යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු වල නියැලීමයි.

## 2.5 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

2012 ජනවාරි මස 01 වන දින සිට ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේදය සඳහා අදාළ වන්නා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමූහය විසින් අනුගමනය කරනු ඇත. මෙම සංක්‍රමණය සඳහා වූ සූදානමක් වශයෙන් ස්වකීය ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය වාර්තාකරණය සමාලෝචනයට හසු කිරීමට සමූහය විසින් කටයුතු අරඹනු ලැබ තිබේ. සමූහය විසින් පවත්වාගෙන යනුයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂයක් නිසා 2011 අප්‍රියෙල් මස 01 වන දිනට නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව ආරම්භක ශේෂ පත්‍රයක් සැකසීමේ කාර්යය සලකා බැලීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. අනාගතයේදී නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත මත ගිණුම්කරණ කටයුතු ඉටු කිරීමේ පදනම මෙමගින් උද්ගත වනු ඇති අතර 2013 මාර්තු 31 වන දිනට අවසන් වර්ෂය සඳහා නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා සාරානුකූලවූ සිය ප්‍රථම හා අභිනව මූල්‍ය ප්‍රකාශ සමූහය විසින් පිළියෙල කරනු ලැබීමේදී එය අවශ්‍ය වනු ඇත. ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන්නා වූ හා සමූහයට අයත් මූල්‍ය ප්‍රකාශ මත බලපෑමක් ඇතිවිය හැකි වන්නාවූ ප්‍රමුඛ ක්ෂේත්‍ර පහත ගෙන හැර දැක්වේ:

(අ). ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 1 (SLFRS 1) – ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති මුල්වරට පිළිපැදීමේදී තමන් එලෙස නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති කරා සංක්‍රමණය වන දිනට වූ සියප්‍රථම හා අභිනව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශ සමූහය විසින් පිළියෙළ කර ඉදිරිපත් කළ යුතුය. සිය ආරම්භක හා අභිනව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශ තුළත්, ස්වකීය ප්‍රථම හා අභිනව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශ තුළින් ඉදිරිපත් කෙරෙන සියලු සංසන්දනාත්මක කාල පරිච්ඡේද පුරාත් සමූහය විසින් එකම ගිණුම් ප්‍රතිපත්තිය භාවිතයට ගත යුතුය. ශ්‍රී.ලං.ගි.ප්‍ර.1 (LKAS 1) - ආයතනයක් විසින් සිය කොටස් ආයෝජන වෙනස්කම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී සියලුම කොටස් ආයෝජන හිමිකාරත්ව වෙනස්කම් සිය මූල්‍ය ප්‍රකාශ තුළ ගෙන හැර දැක්වීම අවශ්‍ය වන්නේය. හිමිකාරත්ව රහිත සියලුම කොටස් ආයෝජන

වෙනස්කම් එක් විස්තීරණ ආදායම් ප්‍රකාශයක් හෝ ආදායම් ප්‍රකාශ දෙකක් තුළින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (වෙනම ආදායම් ප්‍රකාශයක් හා කොටස් ආයෝජන වෙනස්කම් ප්‍රකාශයක්) විස්තීරණ ආදායමේ අවශේෂ අංග කොටස් ආයෝජන වෙනස්කම් ප්‍රකාශයෙහි ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබේ. මෙම ප්‍රමිතිය අනුව, ආයතනයේ පරමාර්ථ, ප්‍රතිපත්ති හා ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ ක්‍රියාවලි පිළිබඳ අගැයුම් කිරීමට සිය මූල්‍ය ප්‍රකාශ පරිහරණය කරන්නන්ට හැකිවන තොරතුරු සමාගම විසින් හෙළිදරව් කළ යුතුවේ.

(ආ). ශ්‍රී. ලං. ගි. ප්‍ර. 16 (LKAS 16) – දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සලකා බලන කළ, ඒවා හඳුනාගනු ලබන දිනයේදී පවත්නා මුදල් මිලට සමාන වටිනාකමක් යොදා ගනිමින් එම දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත යම් අයිතමයකට අයත් වටිනාකම ඒවායේ ගත්මිල අනුව මූලික වශයෙන් මැන බැලීමක් සමාගම විසින් සිදු කළ යුතුවේ. ගෙවීම් සිදු කිරීම ප්‍රමාණික ණය කොන්දේසි ඉක්මවා ප්‍රමාද වේ නම්, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 23 වන ණයගැනුම් පිරිවැයට අනුව පොළිය ප්‍රාග්ධනනිත කර නොමැත්තේ නම් මිස, මුදල් මිලට සමාන වටිනාකම සහ මුළු ගෙවීම අතර වෙනස අදාළ කාල පරිච්ඡේදය සඳහා වූ නියමිත පොළිය ලෙස හඳුනා ගැනේ.

සියලුම වැඩබිම් ප්‍රතිසංස්කරණ වියදම්, වෙනත් පාරිසරික ප්‍රතිසංස්කරණ හා ඊට සමාන වියදම්ද ඇතුළත්ව, අදාළ වත්කම්හි ප්‍රයෝජ්‍ය ආයුකාලය මුළුල්ලේ ඒවායේ පිරිවැය මත ක්ෂය සලසා දිය හැකි වනු පිණිස අදාළ මූලික හඳුනාගැනීමේදීම ඇස්තමේන්තු කර ප්‍රාග්ධනනිත කළ යුතුය.

ක්ෂය සලසා ගත හැකි අගය තීරණය කිරීම සඳහා වත්කම්හි අවශේෂ අගය අඩුකර ඇති අවස්ථාවකදී අදාළ වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය මුළුල්ලේ ක්ෂය කරනු ලැබිය යුතු යැයි මෙම ප්‍රමිතිය මගින් නියම කර ඇත.

(ඇ). ශ්‍රී. ලං. ගි. ප්‍ර. 32 (LKAS 32) – මූල්‍ය සාධන පත්‍ර: ඉදිරිපත් කිරීම,ශ්‍රී. ලං. ගි. ප්‍ර. 39 (LKAS 39) : මූල්‍ය සාධන පත්‍රහඳුනාගැනීම හා මිණුම්කරණය සහ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 (SLFRS 7) – හෙළිදරව් කිරීම යනාදිය මගින් දැනට පවත්නා මූල්‍ය වත්කම්, මූල්‍ය බැරකම් හා ස්කන්ධ සාධන පත්‍ර හඳුනාගැනීමේ ක්‍රමයට වෙනස්කම් සිදු කරයි. මූල්‍යමය වත්කම් හා මූල්‍යමය බැරකම් ඒවායේ සාධාරණ අගය අනුව ආරම්භක මිණුම් අවස්ථාවේදීම මැන බැලීමක් මෙම ප්‍රමිති මගින් නියම කරනු ලැබ තිබේ.
ලාභාලාභ ප්‍රමාණය අනුව සාධාරණ අගය ලෙස හා විකිණිය හැකි වටිනාකම ලෙස වර්ගීකරණය කර ඇති පසු අවස්ථාවලදී සිදු කෙරෙන මූල්‍ය වත්කම් මිණුම්කරණය, ඒවායේ සාධාරණ අගය මත සිදු කරනු ලබනුයේ, පිළිවෙළින්, විස්තීරණ ආදායම් ප්‍රකාශ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශ ඔස්සේ මෙහෙයවන ලද ලාභ හා අලාභ සමගය.

කල්පිරීම දක්වා පවත්වාගැනෙන්නක් ලෙස සහ ණය මුදල් හා ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම්, හිලව් කිරීමේ පිරිවැය මත පසුව මැන බැලේ. මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම් සමූහයකට අයත් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලනය ආශ්‍රිත අලාභ සිදුවීමක (හෝ අලාභ සිදුවීම්වල) බලපෑම මත විශ්වාසදායක ඇස්තමේන්තුවකින් ද්විගුණ වූ වත්කමක මූලික හඳුනාගැනීමකින්

(අලාභ සිදුවීමකින්) අනතුරුව සිදුවන සිද්ධියක් හෝ සිද්ධි කීපයක් හේතුවෙන් විෂයිකව විද්‍යාමාන වන යම් හානිකරණයකට ලක්වනුයේ නම් එකී වත්කම් ඒ අනුව වූ තක්සේරු කිරීම සඳහා භාජනය කළ යුතුය. එහෙයින් දැනට පවත්නා හානිකරණ තක්සේරු ක්‍රමය මෙම නව ප්‍රමිති වල නියමයන් සපුරාලන පරිදි වෙනස් කළ යුතුව ඇත.

මූල්‍ය බැරකම් ලාභ හෝ අලාභ අනුව සාධාරණ අගය වශයෙන් වර්ගීකරණය කිරීම හෝ ගත් මිලට හිලවු කිරීම හෝ සිදුකෙරනු ඇත.දැනට සමූහය, අදාළ ප්‍රමිතිවල නියමයන් අනුව මූල්‍ය වත්කම් හා බැරකම් හඳුනාගැනීම හෝ වර්ගකිරීම හෝ මැන බැලීම හෝ සිදු නොකරන අතර ඇතැම් ව්‍යුත්පන්න සාධන පත්‍ර ශේෂ පත්‍රය තුළ හඳුනා නොගනියි.

(ඇ) ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණය 4 (IFRIC 4) - නීතිමය අනුසාරයෙන් වූ බදුකරයක් නොවන නමුත් ගිවිසගත් කාල සීමාවක් සඳහා දේපළ, පිරියත හා උපකරණ වලට අයත් අයිතමයක් වැනි නිශ්චිත වත්කමක් පරිහරණය පිණිස අයිතිය සලසා දෙන වැඩ පිළිවෙළක් සහිත කල්බදු අඩංගු විධික්‍රමයක්ද නැද්ද යන වග නිශ්චය කිරීම.

වත්කම පරිහරණය සඳහා වන අයිතිය අදාළ විධික්‍රමයේ විෂයාර්ථය මත පදනම්ව ඒ සඳහා ඉඩ සලසා දෙනු ලබන්නේ ද නැද්ද යන වග ඇගැයීම.

මෙම අගැයුමෙහි වැදගත් මූලාංගයක් අදාළ විධික්‍රමය ජනනය කරනු ලබන ඉදිරි මුදල් ප්‍රවාහ ( ආර්ථික ප්‍රතිලාභ) විශ්ලේෂණයක් මත පදනම් වී ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්ප්‍රමිති 10 සම්බන්ධයෙන් සංශෝධනයක් සම්මත කරගනු ලැබ තිබේ. එමගින් ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් හා වැරදි පිළිබඳ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 හි 30 සහ 31 වන ඡේද වල දැක්වෙන විධිවිධාන 2012 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භවන මූල්‍ය වර්ෂ සම්බන්ධයෙන් පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශ වලට අදාළ නොවන බවද, ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ මෙම සංක්‍රමණයේ බලපෑම හෙළිදරව් කළ යුතු නොවන බවද ප්‍රකාශිතය.

## 3 දේපළ, පිරියත සහ උපකරණ

### 3.1 සමූහය

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත හා උපකරණ | මෙහෙයුම් බදුකර මතවූ ගුවන්යානා/එන්ජින් වලට වැඩිදියුණු කිරීම් | ගුවන් යානා ආශ්‍රිත උපකරණ | බදුකර පිරියත හා උපකරණ | කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| 2011.04.01 දිනට ශේෂය | 2,936.32 | 4,748.07 | 560.96 | 5,469.99 | - | 197.80 | 13,913.14 |
| අත්කරගැනීම්/පිළිසකර කිරීම්/ප්‍රත්‍යාගණන | 552.11 | 271.89 | 415.25 | 388.61 | 1,208.03 | 882.04 | 3,717.93 |
| පැවරුම්/ගැළපුම් | 0.05 | (33.61) | - | - | - | (553.56) | (587.12) |
| ව්‍යපහරණ/විසුම්ගැන්වීම් | (82.97) | (91.40) | - | (22.56) | - | - | (196.93) |
| **2012.03.31 දිනට ශේෂය** | 3,405.51 | 4,894.95 | 976.21 | 5,836.04 | 1,208.03 | 526.28 | 16,847.02 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2011.04.01 දිනට ශේෂය | 662.11 | 3,613.77 | 516.44 | 4,473.13 | - | - | 9,265.45 |
| වර්ෂය සඳහා අයකිරීම් | 142.38 | 340.28 | 46.00 | 240.97 | 41.99 | - | 811.62 |
| පැවරුම්/ගැළපුම් | (264.63) | (27.46) | - | (0.93) | - | - | (293.02) |
| ව්‍යපහරණ/විසුම්ගැන්වීම් | (79.50) | (91.40) | - | (4.56) | - | - | (175.46) |
| **2012.03.31 දිනට ශේෂය** | 460.36 | 3,835.19 | 562.44 | 4,708.61 | 41.99 | - | 9,608.59 |
| **2012 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | **2,945.15** | **1,059.76** | **413.77** | **1,127.43** | **1,166.04** | **526.28** | **7,238.43** |
| **2012 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 2,274.21 | 1,134.30 | 44.52 | 996.86 | - | 197.80 | 4,647.69 |

**3.2** (අ) ක්ෂය කරන ලද ප්‍රතිස්ථාපන පිරිවැය පදනම මත පිහිටා ස්වාධීන තක්සේරුවකරුවකු වූ රන්ජන් ජේ. සමරකෝන් මහතා ප්‍රත්‍යාගණනය කිරීමක අනුසාරයෙන් 2011.03.31 දිනට අවසන් මූල්‍ය වර්ෂය තුළ සමාගමට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නිශ්චය කරන ලදි. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල 2012 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කර ඇත. ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයක් වෙත මාරු කරන ලදි.

ස්වාධීන තක්සේරුකරුවෙකු වූ පී.බී. කළුගලගෙදර මහතා ප්‍රත්‍යාගණනයකිරීමක අනුසාරයෙන් 2011.03.31 දිනට අවසන් වර්ෂය තුළ අනුබද්ධ සමාගමට අයත් දේපළ, පිරියත හා උපකරණවල සාධාරණ අගය නිශ්චය කරන ලදි. ඉඩම් හා ගොඩනැගිලි, ශුද්ධ ආදායම් පදනම මත තක්සේරු කරන ලද අතර, ඉතිරි පිරියත හා උපකරණ, ක්ෂය කරන ලද ප්‍රතිස්ථාපන පිරිවැය පදනම මත තක්සේරු කෙරිණි. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල මෙම මූල්‍ය ප්‍රකාශ තුළ එහි ක්‍රියාත්මක දිනය වන 2010 දෙසැම්බර් මස සිට අන්තර්ගත කර ඇත. ප්‍රත්‍යාගණනයෙන් උද්ගතවූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයක් වෙත මාරු කරන ලදි.

(ආ) සමාලෝචිත වසර තුල සමූහය විසින් රු.මි. 2,692.37 ක් වූ සමුච්චිත වටිනාකමක් සහිත දේපළ, පිරියත හා උපකරණ අත්කර ගන්නා ලදි. (2011 - රු.මි. 908.53) දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම සඳහා වසර තුළ රු.මි.1,503.93 ක් වශයෙන් ගණනය වූ මුදල් ගෙවීම් සිදුකරන ලදි. (2011-රු.මි.968.33)

(ඇ) රු.මි. 8,479.37 ක්වූ ඉදිරියට ගෙනයන දළ මුදල් ප්‍රමාණයක් (2011 - රු.මි. 8, 310.91) සහිත සම්පූර්ණ ක්ෂය සලසා ඇති වත්කම් ප්‍රමාණයක් සමූහයේ දේපළ, පිරියත හා උපකරණ තුළ අන්තර්ගත වේ.

## 3 දේපළ, පිරියත සහ උපකරණ (පරිච්ඡින්න)

### 3.3 සමාගම

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියතහා උපකරණ | මෙහෙයුම් බදු මත වූ ගුවන් යානා එන්ජින් වලට වැඩිදියුණු කිරීම | ගුවන් යානා ආශ්‍රිත උපකරණ | බදුකර පිරියත හා උපකරණ | කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| 2011.04.01 දිනට ශේෂය | 1,688.12 | 3,852.20 | 560.96 | 5,469.99 | - | 197.80 | 11,769.07 |
| අත්කරගැනීම්/පිළිසකර කිරීම්/ප්‍රත්‍යාගණන | 552.11 | 184.57 | 415.25 | 388.61 | 1208.03 | 882.04 | 3630.61 |
| පැවරුම්/ගැළපුම් | .05 | (33.61) | - | - | - | (553.56) | (587.12) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (82.97) | (91.40) | - | (22.56) | - | - | 196.93 |
| **2012.03.31 දිනට ශේෂය** | 2,157.31 | 3,911.76 | 976.21 | 5,836.04 | 1,208.03 | 526.28 | 14,615.63 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2011.04.01 දිනට ශේෂය | 655.56 | 3,565.12 | 516.44 | 4473.13 | - | - | 9210.25 |
| වර්ෂය සඳහා අයකිරීම් | 79.97 | 148.28 | 46 | 240.97 | 41.99 | - | 557.21 |
| පැවරුම්/ගැළපුම් | (264.62) | (27.46) | - | (0.93) | - | - | (293.01) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (79.50) | (91.40) | - | (4.56) | - | - | (175.46) |
| **2012.03.31 දිනට ශේෂය** | 391.41 | 3,594.54 | 562.44 | 4,708.61 | 41.99 | - | 9298.99 |
| **2012 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | **1,765.90** | **317.22** | **413.77** | **1127.43** | **1166.04** | **526.28** | **5,316.64** |
| **2011 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 1,032.56 | 287.08 | 44.52 | 996.86 | - | 197.80 | 2,558.82 |

3.4 (අ) ක්ෂය කරන ලද ප්‍රතිස්ථාපන පිරිවැය පදනම මත පිහිටා ස්වාධීන තක්සේරුකරුවෙකු වූ රන්ජන් ජේ. සමරකෝන් මහතා ප්‍රත්‍යාගණන කිරීමක අනුසාරයෙන් මූල්‍ය වර්ෂය තුළ සමාගමට අයත් ඉඩම් හා ගොඩනැගිලි වල සාධාරණ අගය නිශ්චය කරන ලදි. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල 2012 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කර ඇත. ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයක් වෙත මාරු කරන ලදි. ක්ෂය කිරීම් ඌණ පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කළයුතුව තිබූ ප්‍රත්‍යාගණනිත වත්කම් වල ධාරණ මුදල් ප්‍රමාණය පහත දැක්වේ:

| වත්කම් වර්ගය | පිරිවැය | පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් සමුච්චිත ක්ෂය | 2012 දී ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම | 2011 දී ඉදිරියට ගෙනයන ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,176.97 | 278.15 | 898.82 | 870.58 |

(ආ) සමාලෝචිත වසර තුළ සමාගම විසින් රු.මි. 2,605.05 ක් වූ සමුච්චිත වටිනාකමක් සහිත දේපළ, පිරියත හා උපකරණ අත්කර ගන්නා ලදි. (2011: රු.මි. 833.99) දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම සඳහා වසර තුළ රු.මි. 1,428.75 ක් වශයෙන් ගණනය වූ මුදල් ගෙවීම් සිදු කරන ලදි. (2011: රු.මි. 894.13)

(ඇ)රු.මි. 8,451.82 ක් වූ ඉදිරියට ගෙන යන දළ මුදල් ප්‍රමාණයක් (2011: රු.මි. 8308.68) සහිත සම්පූර්ණ ක්ෂය සලසා ඇති වත්කම් ප්‍රමාණයක් සමාගමේ දේපළ, පිරියත හා උපකරණ තුළ අන්තර්ගත වේ.

## 4. ගුවන්යානා එන්ජින් වල ප්‍රධාන අළුත්වැඩියා හා වැඩිදියුණු කිරීම්

| සමූහය/සමාගම | 2012 | 2011 |
|---|---|---|
| | රු.මි. | රු.මි. |
| **පිරිවැය** | | |
| අප්‍රියෙල් 01 දිනට ශේෂය | 11,738.70 | 9,415.87 |
| වසර තුළ දරන ලද (ශුද්ධ) | 3,425.85 | 2,593.13 |
| වසර තුළ හඳුනා නොගැනීම් | (1,078.64) | (270.30) |
| **මාර්තු 31 දිනට ශේෂය** | **14,085.91** | **11,738.70** |
| **සමුච්චිත ක්ෂයවීම** | | |
| අප්‍රියෙල් 01 දිනට ශේෂය | 5,658.34 | 3,459.79 |
| වසර තුළ දරන ලද (ශුද්ධ) | 2,821.33 | 2,468.85 |
| වසර තුළ හඳුනා නොගැනීම් | (1,078.64) | (270.30) |
| **මාර්තු 31 දිනට ශේෂය** | **7,401.03** | **5,658.34** |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | **6,684.88** | **6,080.36** |

## 5. ගුවන් යානා නඩත්තු සංචිතය

| | 2012 වසරක් තුළ අයකර ගත හැකි මුදල | 2012 වසරකින් පසු අයකර ගත හැකි මුදල | 2012 එකතුව | 2011 වසරක් තුළ අයකර ගත හැකි මුදල | 2011 වසරකින් පසු අයකර ගත හැකි මුදල | 2011 එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| ගුවන් යානා නඩත්තු සංචිතය (සටහන 5.1) | 2,608.50 | 15,372.86 | 17,981.36 | 2,505.16 | 8,849.84 | 11,356.00 |

| | 2011.04.01 දිනට ශේෂය | ගෙවීම් | උපචිත පොළිය | අයකර ගැනීම් | 2012 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **5.1ගුවන් යානා නඩත්තු සංචිතය** | 11,356.00 | 6,483.41 | 59.79 | (2,156.71) | 15,742.49 |
| අඩුකළා: අඩමාන අයකර ගැනීම් ප්‍රතිපාදනය | | | | | (208.48) |
| උපලබ්ධි නොවූ විනිමය අලාභය | | | | | 2,447.35 |
| අයකර ගත හැකි ශුද්ධ වටිනාකම | | | | | 17,981.36 |

**6 අස්පෘෂ්‍ය වත්කම්**

| | පරිගණක | මෘදුකාංග |
|---|---|---|
| | සමූහය | සමාගම |
| | රු.මි. | රු.මි. |
| **පිරිවැය** | | |
| 2011.04.01 දිනට ශේෂය | 681.87 | 654.03 |
| අත්කර ගැනීම්/පිළිසකර කිරීම් | 1.55 | 1.40 |
| පැවරුම්/ගැළපුම් | 17.75 | 17.75 |
| **2012 මාර්තු 31 දිනට ශේෂය** | 701.17 | 673.18 |
| **සමුච්චිත ක්ෂයවීම** | | |
| 2011.04.01 දිනට ශේෂය | 570.18 | 543.96 |
| වර්ෂය සඳහා අය කිරීම | 56.95 | 55.52 |
| පැවරුම්/ගැළපුම් | 17.93 | 17.93 |
| **2012 මාර්තු 31 දිනට ශේෂය** | 645.06 | 617.41 |
| **2012 මාර්තු 31 වන දිනට ශුද්ධ පොත් අගය** | **56.11** | **55.77** |
| **2011 මාර්තු 31 වන දිනට ශුද්ධ පොත් අගය** | 111.69 | 110.07 |

රු.මි. 419.44 ක් වූ ඉදිරියට ගෙන යන දළ මුදල් ප්‍රමාණයක් (2011-රු.මි. 401.22) සහිත සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රමාණයක් සමාගමේ අස්පෘෂ්‍ය වත්කම් තුළ අන්තර්ගත වේ.

## 7. ආයෝජන

### 7.1 සමූහය

| | සංස්ථාපිත රට | 2012 හිමිකාරිත්වය % | 2012 පිරිවැය රු.මි. | 2011 පිරිවැය රු.මි |
|---|---|---|---|---|
| **ජංගම නොවන** | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන (සටහන 7.3) | | | 14,165.94 | - |
| **කොටස් ඇපකරවල ආයෝජන** | | | | |
| -සිටා ඉන්කෝපරේෂන් පදනම ( සටහන 7.4) | නෙදර්ලන්තය | | 65.83 | 64.96 |
| -එයාලංකා (පෞද්ගලික) සමාගම (කොටස් 40,000) | ශ්‍රී ලංකාව | 100% | 0.40 | 0.40 |
| | | | 66.23 | 65.36 |
| | | | **14,232.17** | **65.36** |

### 7.2සමාගම

| | සංස්ථාපිත රට | 2012 හිමිකාරිත්වය % | 2012 | 2011 |
|---|---|---|---|---|
| **ජංගම නොවන** | | | 14,165.94 | - |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන (සටහන 7.3) | | | | |
| **කොටස් ඇපකරවල ආයෝජන** | | | | |
| -ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්(රු.බි. 4.63 වූ ශුද්ධ වත්කම් අගය මත අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව මත පදනම් වී ඇත. (2011-රු.බි. 2.18)) | ශ්‍රී ලංකාව | 100% | 42.24 | 42.24 |
| - සිටා ඉන්කෝපරේෂන් පදනම ( සටහන 7.4) | නෙදර්ලන්තය | | 65.83 | 64.96 |
| - එයාලංකා (පෞද්ගලික) සමාගම (කොටස් 20,000) | ශ්‍රී ලංකාව | 50% | 0.20 | 0.20 |
| | | | 108.27 | 107.40 |
| | | | **14,274.21** | **107.40** |

**7.3**ශ්‍රී ලංකා රජය වසර තුළ රු.බි. 15.4 ක මුහුණත වටිනාකමකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර අනුසාරයෙන් වූ මුදල් ප්‍රමාණයක් සමාගම තුළ ආයෝජනය කරන ලදි. වාර්ෂික 8% ක් වූ කූපන්පත් පොළියක් සමඟ 2017 ජනවාරි මස 01 වන දින මෙම බැඳුම්කරය කල්පිරීමට නියමිතය. අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමිකරුවන්ගේ අනුමැතියට යටත්ව හිමිකම් නිකුතුවක අනුසාරයෙන් වූ සාමාන්‍ය කොටස් නිකුතුවක් සඳහා බලය දී ඇත. මෙම කොටස් නිකුතුව සඳහා වන කොටස් හිමියන්ගේ අනුමැතිය මීළඟ මුදල් වර්ෂයේදී පැවැත්වෙන අතිවිශේෂ මහසභා රැස්වීමකදී අපේක්ෂා කරනු ලැබේ.

| | රු.මි. |
|---|---|
| මුහුණත වටිනාකම | 15,423.08 |
| අඩුකළා: හිලව් නොකළ වට්ටම් | (1,257.14) |
| ආයෝජන වටිනාකම | 14,165.94 |

**7.4**සිටා ඉන්කෝපරේෂන් පදනමෙහි කර ඇති ආයෝජනය මගින් ස්ථාවර කල්පිරීම් කාලයක් නොමැති සඳහන් නොකළ තැන්පතු සහතික නියෝජනය වේ.

## 8 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

| | සමූහය 2012 රු.මි. | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය හා අමතර දෑ | 4,853.46 | 5,135.18 | 4,757.39 | 5,059.83 |
| අමුද්‍රව්‍ය | 189.79 | 159.33 | - | - |
| තීරුබදු රහිත වෙළඳ ද්‍රව්‍ය | 54.79 | 68.02 | 54.79 | 68.02 |
| අඩුකළා : මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන (සටහන 8.1) | (584.28) | (872.34) | (579.80) | (867.86) |
| | 4,513.76 | 4,490.19 | 4,232.38 | 4,259.99 |

### 8.1 මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය

| | සමූහය 2012 රු.මි | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| අප්‍රියෙල් 01 දිනට ශේෂය | (872.34) | (777.43) | (867.86) | (772.95) |
| වසර තුළ සිදුකළ ප්‍රතිපාදනය | (156.65) | (207.16) | (156.65) | (207.16) |
| වසර තුළ කපා හැරීම් | 389.46 | 3.30 | 389.46 | 3.30 |
| වසර තුළ ප්‍රත්‍යාවර්තන | 55.25 | 108.95 | 55.25 | 108.95 |
| මාර්තු 31 වන දිනට ශේෂය | (584.28) | (872.34) | (579.80) | (867.86) |

## 9 වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත

| | සමූහය 2012 රු.මි | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| වෙළඳ ලැබීම් නියමිත | 11,208.17 | 8,500.45 | 10,676.17 | 8,248.65 |
| අඩුකළා: අඩමාන ණය ප්‍රතිපාදනය | (334.11) | (334.11) | (309.44) | (309.44) |
| | 10,874.06 | 8,166.34 | 10,366.73 | 7,939.21 |
| වෙනත් ණයගැතියෝ | 1,487.36 | 1,143.65 | 1,355.79 | 980.39 |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 1,472.51 | 1,196.52 | 1,387.66 | 1,093.95 |
| | 13,833.93 | 10,506.51 | 13,110.18 | 10,013.55 |
| සමාගමේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් (සටහන 9.1) | 63.37 | 47.20 | 50.74 | 41.72 |
| | **13,897.30** | **10,553.71** | **13,160.92** | **10,055.27** |

## 9.1 සමාගමේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම්

සමාගමේ නිලධාරීන්ට දෙන ලද රු.20,000 ක් පමණක් ඉක්මවූ ණය මුදල් වල විස්තර පහත දැක්වේ.

| | සමූහය 2012 රු.මි | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| අප්‍රියෙල් 01 දිනට ශේෂය | 18.31 | 12.90 | 2.61 | 2.52 |
| වසර තුළ දෙන ලද ණය | 12.71 | 9.52 | 2.69 | 2.74 |
| ආපසු ගෙවීම් | (9.37) | (4.11) | (3.04) | (2.65) |
| මාර්තු 31 දිනට ශේෂය | 21.65 | 18.31 | 2.26 | 2.61 |

## 10 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සාම්‍යයන්

| **මුදල් හා මුදල් සාම්‍යයන්හි අංග** | සමූහය 2012 රු.මි | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| **10.1 හිතකර මුදල් හා මුදල් සාම්‍යයන්හි ශේෂ** | | | | |
| මුදල් හා බැංකු ශේෂ | 1,749.57 | 1,660.96 | 1,455.24 | 1,358.89 |
| කෙටිකාලීන තැන්පතු | 278.08 | 96.28 | 278.08 | 96.28 |
| | 2,027.65 | 1,757.24 | 1,733.32 | 1,455.17 |
| **10.2අහිතකර මුදල් හා මුදල් සාම්‍යයන්හි ශේෂ** | | | | |
| බැංකු අයිරා (සටහන 14) | (5,366.04) | (5,610.36) | (5,366.04) | (5,610.36) |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුළු මුදල් සහ මුදල් සාම්‍යයන් | (3,338.39) | (3,853.12) | (3,632.72) | (4,155.19) |

## 11 ප්‍රකාශිත ප්‍රාග්ධන

**සමූහය/සමාගම**

| | 2012 රු.මි. | 2012 රු.මි. |
|---|---|---|
| නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් 51,463,463 | 5,146.35 | 5,146.35 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් (සටහන 7.3) | 14,286.32 | - |
| | 19,432.67 | 5,146.35 |

## 12. සංචිත

| | සමූහය 2012 රු.මි | සමූහය 2011 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011 රු.මි. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන සංචිත (සටහන 12.1) | 2,522.65 | 1,785.98 | 1,850.94 | 1,114.27 |
| ආදායම් සංචිත | 0.63 | 0.63 | 0.63 | 0.63 |
